# රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

## අධ්‍යක්ෂ ජනරාල්ගේ

# කාර්ය සාධන වාර්තාව

## 2012 වර්ෂය

# දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා රබර් වගාව හා කර්මාන්තය මෙහෙයවීම

# මෙහෙවර

රබර් වගාව හා කර්මාන්තයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක වර්ධනය උදෙසා නෛතික විධිවිධාන ක්‍රියාත්මක කිරීම, රබර් වගාව සඳහා මූල්‍ය සහනාධාර, කෘෂි යෙදවුම් හා ව්‍යාප්ති සේවා සැපයීම සහ රබර් කර්මාන්තයේ සංවර්ධනය.

# අරමුණු

රබර් වගා බිම් වල ඵලදායිතාවය වැඩි කිරීම

රබර් වගා බිම් ප්‍රමාණය වැඩි කිරීම

# පෙරවදන

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් 2010 වසරේ පවත්වන ලද රබර් ඉඩම් සංගණනයෙන් ලැබුණු තොරතුරු පාදක කරගෙන 2012 වර්ෂයේ ඇස්තමේන්තු ගත මුළු රබර් වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 130780 ක් වේ. එම බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර 82170 ක් කුඩා රබර් වතු අංශයට ද, හෙක්ටයාර 48610 ක් රාජ්‍ය වතු අංශයට ද අයත් වේ. වර්ෂයේ මුළු රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 152049 ක් වූ අතර මෙය පෙර වර්ෂය සමග සැසඳීමේ දී 3.90% ක අඩුවීමක් පෙන්නුම් කරයි. මුළු රබර් නිෂ්පාදනයෙන් 39% ක් ෂීට් රබර් වන අතර 29% ක ප්‍රතිශතයක් රබර් කිරි නිෂ්පාදනය හා 26% ක ප්‍රතිශතයක් ක්‍රේප් රබර් නිෂ්පාදනයට හා 6%ක ප්‍රතිශතයක් බ්ලොක් රබර් නිෂ්පාදනය සඳහාද වෙන් වී ඇත. මුළු රබර් නිෂ්පාදනයෙන් 25% අපනයනය කර ඇති අතර 72% දේශීය කර්මාන්තකරුවන් විසින් පරිභෝජනය කර තිබේ. අමු රබර් අපනයනයේ මුළු වටිනාකම රු. මි. 15726.00 කි. මලයාසියාව, පාකිස්ථානය හා ඉන්දියාව, ජර්මනිය, ඇමරිකාව ශ්‍රී ලංකාවේ අමු රබර් මිලදී ගන්නා ප්‍රධාන රටවල් වන අතර එම රටවල් මිලදී ගත් රබර් ප්‍රමාණය මුළු අපනයන ප්‍රමාණයෙන් 71% කි. 2012 වර්ෂයේ ෂීට් රබර් කිලෝ ග්‍රෑම් 1 ක සාමාන්‍ය මිල රුපියල් 416.61 ක් වූ අතර එය පෙර වර්ෂයට වඩා 19% ක මිල පහල යාමක් විය.

රජයේ මැදිහත්වීම මත රබර් කර්මාන්තයේ උන්නතිය උදෙසා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගන්නා ලද පියවරයන් රබර් නිෂ්පාදනයේ දියුණුවට බොහෝ දුරට ඉවහල්වී ඇත. 2012 වර්ෂය සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 1051.83 ක ප්‍රතිපාදන වෙන්වූ අතර රුපියල් මිලියන 632.00 ක වියදමක් දරා ඇති අතර ප්‍රගතිය 60% ක් විය. රජයේ තවාන්වල වසරේ පැල නිෂ්පාදනය මිලියන 2 ක් වූ අතර බෙදා හැරි ප්‍රමාණය පැල මිලියන 1.36 ක් විය.

මේ අනුව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය වැඩිවීම තුලින් 2012 වසර රබර් අංශයේ වාර්ෂික ඉලක්ක සපුරාගත් සුවිශේෂී දියුණුවක් ලද වසරක් විය. රබර් නිෂ්පාදනය ඉහල නැංවීමට වෙන්කල ප්‍රතිපාදන උපරිම ලෙස ආයෝජනය කිරීම, මිනිස් හා භෞතික සම්පත් සංවර්ධනය කිරීම, වැඩි දායකත්වයක් හා ඇප කැපවීම හා සේවක තෘප්තිය යනාදී කරුණු තුලින් ද මෙම වසරේ දී සීඝ්‍ර දියුණුවක් ලබා ඇත.

සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල රබර් වගාව ව්‍යාප්ත කිරීමේ වැඩසටහන යටතේ මොණරාගල, හම්බන්තොට මෙන්ම අම්පාර, අනුරාධපුර, පොළොන්නරුව දිස්ත්‍රික්කයන් වලද, සාමකාමී වාතාවරණයක් තුල උතුරු පළාත් සංවර්ධනය කිරීමේ වැඩසටහනට දායක වෙමින් වවුනියා දිස්ත්‍රික්කයේ වවුනියාව හා නැඳුන්කර්නි ප්‍රදේශ වලටද, මුලතිව් දිස්ත්‍රික්කයේ ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේ ද නව රබර් වගාව ආරම්භ කිරීමට 2011 වසරේදී යොදන ලද කටයුතු තවදුරටත් ක්‍රියාත්මක කිරීම 2012 වසරේදී සිදු කරන ලදී.

දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන යටතේද රබර් වගාවේ සංවර්ධනය උදෙසා අම්පාර, මොණරාගල, බදුල්ල, හම්බන්තොට, වවුනියාව සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක වල පාළු සිටුවීම සඳහා රබර් පැල 93177 ක් සපයන ලද අතර අතුරු භෝග වගාව සඳහා කෙසෙල් හා අන්නාසි පැල 74406 ක ප්‍රමාණයක් සපයන ලදී.

ඒ සඳහා විවිධාකාරයෙන් සහාය ලබාදුන් සැමට මාගේ ස්තුතිය පුද කරමි.

ආර්. බී. ප්‍රේමදාස

අධ්‍යක්ෂ ජනරාල්

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

# පටුන


| | |
|---|---|
| 1. හැඳින්වීම | 1 |
| 1.1 ඓතිහාසික පසුබිම | 1 |
| 1.2 මෙම දෙපාර්තමේන්තුවට ප්‍රධාන හා වැදගත් නෛතික මූලාශ්‍ර | 2 |
| 1.2.1 1953 අංක 36 දරණ රබර් නැවත වගා සහනාධාර පනත | 2 |
| 1.2.2 1956 අංක 11 දරණ රබර් පාලන පනත | 2 |
| 1.2.3 2006 අංක 20 දරණ රබර් නැවත වගා කිරීමේ සහනාධාර (සංශෝධිත ) පනතින් පැනවෙන සෙස් බදු නියෝග | 3 |
| 1.3 දෙපාර්තමේන්තුවේ ආයතනික සංයුතිය | 4 |
| 1.3.1 ප්‍රධාන කාර්යාලයේ මූලික කාර්යභාරය | 5 |
| 1.3.2 ප්‍රාදේශීය කාර්යාල මගින් ඉටුකරන ප්‍රධාන සේවාවන් | 6 |
| 1.3.3 රජයේ තවාන්වල ප්‍රධාන කාර්යයන් | 7 |
| 2. කාර්ය සාධන ප්‍රගතිය - 2012 වසර | 8 |
| 2.1 රබර් වගා සහනාධාර වැඩසටහන | 8 |
| 2.2 වැහි ආවරණ යෙදීමේ වැඩසටහන | 8 |
| 2.3 අතුරු භෝග වැඩසටහන | 9 |
| 2.4 පුහුණු වැඩසටහන් | 9 |
| 2.5 දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන | 9 |
| 3 ස්වභාවික රබර් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු 2012 | 10 |
| 3.1 රබර් වගා බිම් ප්‍රමාණය | 10 |
| 3.2 නිෂ්පාදනය හා නිෂ්පාදන වියදම | 10 |
| 3.2.1 නිෂ්පාදනය | 10 |
| 3.2.2 නිෂ්පාදන වියදම | 11 |
| 3.3 දේශීය රබර් පරිභෝජනය | 12 |
| 3.4 අපනයනය | 13 |
| 3.5 රබර් මිල | 14 |
| 3.6 රබර් අංශයේ සේවක වැටුප් | 15 |
| 3.7 රබර් වැව්ලි ද්‍රව්‍ය අපනයනය | 15 |
| 3.8 රබර් වෙළඳුන් | 15 |

| | |
|---|---|
| 3.9 රබර් නැවත වගා / අළුත් වගා සහනාධාර ක්‍රමය | 16 |
| 3.10 "මහින්දචින්තනය" ක්‍රියාත්මක කිරීම හා නවවගාවද ඇතුලත්ව රබර් වගාකිරීමේ ප්‍රගතිය | 16-20 |
| 3.11 විදේශාධාර[ IFAD] මත ක්‍රියාත්මක වන මොණරාගල විශේෂ වැඩසටහන | 20 |
| 3.12 රබර් පැළ තවාන් සහ පැල සැපයීම් | 21 |
| 3.12.1 පුද්ගලික සහ වාණිජ තවාන් බලපත්‍ර 2012 | 21-22 |
| 3.13 අතුරු භෝග වගාව | 23 |
| 3.14 වැහි ආවරණ භාවිතය ප්‍රචලිත කිරීම | 23 |
| 3.15 තේ, රබර් සහ පොල් ඉඩම් කැබලි කිරීම පාලනය කිරීමේ මණ්ඩලයේ කටයුතු | 24 |
| 3.16 ජාත්‍යන්තර සංවිධානවල සාමාජිකත්වය | 25 |
| 3.17 ප්‍රධාන පනත් යටතේ නඩු පැවරීම් කටයුතු | 25-26 |
| 3.18 සහනාධාර ගෙවීම් | 26 |
| 3.19 විශේෂ සංවර්ධන වැඩසටහන් | 27 |
| 3.19.1අම්පාර දිස්ත්‍රික්කයේ රබර් වගාව ව්‍යාප්ත කිරීම | 27 |
| 3.19.2 දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන - 2012 | 27-28 |
| 3.20 ඒකාබද්ධ අරමුදල | 28 |
| 3.21 ප්‍රචාරක වැඩසටහන් | 29-30 |
| 3.22 සෙස් බදු පිළිබඳ කටයුතු | 30-31 |
| 3.23 තොරතුරු තාක්ෂණය හා පරිගණක කටයුතු | 32 |
| 3.24 පරිපාලන කටයුතු | 32-34 |
| 3.25 නැවත වගාකිරීමේ උපදේශක මණ්ඩලය | 34 |
| 3.26 විගණන කටයුතු | 34 |
| 4. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු | 35 |
| 5. අනිකුත් ආයතනවල සේවාවන් ඉටුකිරීම | 36 |
| 6. පොදුකරුණු | 37 |
| 6.1 නව වසරේ රාජකාරි ආරම්භ කිරීම | 37 |
| 6.2 උත්සව | 37 |
| රබර් පාලන අරමුදල සඳහා වූ විගණකාධිපති වාර්තාව 2012 | |
| රබර් නැවත වගා සහනාධාර අරමුදල සඳහා වූ විගණකාධිපති වාර්තාව 2012 | |

# ස්තුතිය

2012 රබර් සංවර්න දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය අතින් සුවිශේෂී වසරක් විය. වර්ෂ කීපයක සිට අඛණ්ඩව ඵලදායිතාවයේ සිදුවූ වර්ධනය වැඩි රබර් පැල ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම, වැඩි බිම් ප්‍රමාණයක රබර් වගා කිරීම, වෙන්කල ප්‍රතිපාදන මුදල් වැඩි ප්‍රතිශතයක් ආයෝජනය කිරීමෙන් වගා සංවර්ධනය කිරීම, මිනිස් සම්පත් දියුණු කිරීම, භෞතික සම්පත් සංවර්ධනය කිරීම, වැඩි දායකත්වය හා ඇප කැපවීම, සේවක තෘප්තිය යනාදී කරුණු අතින් මෑත ඉතිහාසයේ ඉහලම තැනකට පැමිණීමට සමත් වීමු. ඒ සඳහා විවිධාකාරයෙන් සහායදුන් සැමට අපගේ හෘදයාංගම ස්තුතිය පළ කරමු.

ආර්. බී. ප්‍රේමදාස
අධ්‍යක්ෂ ජනරාල්
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

# 1. හැඳින්වීම

දශක ගණනාවක සිට ශ්‍රී ලංකාවට විදේශ විනිමය ලබා දෙන ප්‍රධාන ආර්ථික වැවිලි භෝගයක් ලෙසට රබර් වගාව  මෙරට ආර්ථිකයට ශක්තිමත් දායකත්වයක් ලබා දී ඇත. ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක දහහතරක රබර් වගාව ව්‍යාප්ත වී ඇති අතර මේ වන විට මුලතිව්, වවුනියාව, කිලිනොච්චි, පොළොන්නරුව හා අනුරාධපුර යන දිස්ත්‍රික්ක වලටද රබර් වගාව හඳුන්වා දී ඇත.

## 1.1 ඓතිහාසික පසුබිම

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ එනම් 1876 වර්ෂයේ "හෙන්රි වික්හෙම්" නැමැති ඉංග්‍රිසි ජාතිකයා මුල්ම රබර් පැලය ගම්පහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානයේ රෝපනය කරමින් ශ්‍රී ලංකාවට රබර් ගස හඳුන්වා දෙන ලදී. ඉන් වසර 07 කින් පසු ඇරඹුණු රබර් වගාව දකුණු ආසියාව පුරා ව්‍යාප්ත වී රබර් නිෂ්පාදනය, සීඝ්‍රයෙන් ඉහළ ගියේය. ඊට ප්‍රතිලෝමව රබර් මිල පහළ යාම නිසාම මිල ස්ථාවර කිරීමේ අරමුණින් බ්‍රිතාන්‍යයන් විසින් 1922 දී " ස්ටීවන්සන් පටිපාටිය" හඳුන්වා දුනි. නිෂ්පාදන පංගු ක්‍රමයක් හා වැවිලි සීමා කිරීම් සහිතවූ එම පටිපාටියට රබර් වගා කරුවන්ගෙන්ම ඇතිවූ විරෝධය නිසා එය 1928 දී අත්හිටුවීය. එසැනින්ම නැවත රබර් සැපයුම වැඩිවී මිල පහළ යාමෙන් පසු 1934 දී රබර් කර්මාන්තයට සම්බන්ධිත සියලු රටවල්වල එකඟතාවයෙන් " International Rubber Regulation Agreement " නැමති ගිවිසුම අත්සන් කෙරිණි. ස්ටීවන්සන් පටිපාටියට සමානවූ කොන්දේසි වලින් සමන්විත එම ගිවිසුමේ වගන්ති ක්‍රියාත්මක කිරීම සඳහා රබර් වවන රටවල රබර් පාලනය සඳහා රාජ්‍ය ආයතන බිහි කරන ලදී. ඒ අනුව " 1934 දී අංක 06 දරණ ආඥා පනත " මගින් රබර් පාලන දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. එම දෙපාර්තමේන්තුවේ මුල්ම රබර් පාලකවරයා වූයේ පී. සරවනමුත්තු මැතිතුමාය. 1994 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයක් පරිදි දෙපාර්තමේන්තුවේ නාමය රබර් "සංවර්ධන දෙපාර්තමේන්තුව" යනුවෙන් සංශෝධනය කරන ලදී.

1953 දී රබර් නැවත වගාව සඳහා වූ  " 1953 අංක 36 දරණ රබර් නැවත වගා සහනාධාර පනත " ක්‍රියාත්මක කරන ලදී. රබර් නැවත වගාවට ඉඩ සැලසෙන අයුරින් " 1934 අංක 06 දරණ රබර් පාලන ආඥා පනත " ප්‍රතිශෝධනය කරමින් " 1956 අංක 11 දරණ රබර් පාලන පනත " සම්මත කරගත් අතර එම පනත හා " 1953 අංක 36 දරණ රබර් නැවත වගා සහනාධාර පනත " ට අදාල නියෝග අනුව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු මෙහෙයවමින් පවතී.

තවද මෙම දෙපාර්තමේන්තුවට රබර් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික උපදෙස් ලබා දෙමින් ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයත්, කුඩා ඉඩම් හිමියන්ට අලෙවි හා ව්‍යාප්ති සේවා ලබා දෙමින් තුරුසවිය අරමුදලත් දායකත්වය ලබා දෙන ආයතන දෙකකි.

## 1.2 රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල ප්‍රධාන හා වැදගත් නෛතික මූලාශ්‍ර

**1.2.1 1953 අංක 36 දරණ රබර් නැවත වගා සහනාධාර පනත;**

මේ පනත යටතේ පහත සඳහන් කටයුතු ක්‍රියාත්මක වේ.

- රබර් නැවත වගා කිරීම, රබර් නව වගාව, අතුරු භෝග වගාව, කර්මාන්තශාලා නවීකරණය හා ක්‍රම පාලනය
- මෙම පනතේ 7 වගන්තිය යටතේ සෙස් බද්ද පනවා ඇත.

**1.2.2 1956 අංක 11 දරණ රබර් පාලන පනත**

රබර් පාලන පනතේ විධි විධාන යටතේ මෙරට පවත්නා සියලුම කුඩා රබර් ඉඩම් හා රබර් වතුවල වගාව, අයිතිකරුවන්, බිම් ප්‍රමාණ ආදිය සටහන් වන ලේඛනයක් පවත්වාගන යෑම රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යවස්ථාපිත කාර්යයකි. රබර් පාලන පනත යටතේ රබර් වගාව පවතින අක්කර 10 ට වැඩි ( හෙක්ටයාර 4.04 ට වැඩි ) රබර් වගාවක් "වත්තක් " ලෙසත්, අක්කර 10 ට අඩු (හෙක්ටයාර 4.04 ට අඩු) රබර් වගාවක් "කුඩා ඉඩමක්" ලෙසත් අර්ථකථනය කර ඇත.

මේ පනත යටතේ පහත සඳහන් කටයුතු ක්‍රියාත්මක වේ

- සියලු රබර් වතු හා කුඩා ඉඩම් ලියාපදිංචි කිරීම.
- ලියාපදිංචි කිරීම් අවශ්‍ය අවස්ථාවල සංශෝධනය කිරීම.
- රබර් අළුතින් වගා කිරීමට හා නැවත වගා කිරීමට අවසර පත්‍ර නිකුත් කිරීම.
- රබර් වෙළඳුන්ට බලපත්‍ර නිකුත් කිරීම සහ රබර් මිලට ගැනීම හා විකිණීමට අදාල තොරතුරු එක් රැස් කිරීම.
- නිෂ්පාදකයන්ට බලපත්‍ර නිකුත් කිරීම.
- රබර් ඇට හා පැල නිර්යාත කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- රබර් පාලන අණ පනත් ක්‍රියාත්මක කිරීමේදී පිහිටුවා ඇති රබර් පාලන අරමුදලට අවශ්‍ය මුදල් ලබා ගැනීම සඳහා අපනයන තීරු බදු පැනවීම. (36 වන වගන්තිය)
- වගා කල රබර් ප්‍රමාණය, නිෂ්පාදනය, පරිභෝජනය හා අපනයනය පිළිබඳ සංඛ්‍යාලේඛණ එක්රැස් කිරීම.
- ජාත්‍යන්තර රබර් අධ්‍යයන කණ්ඩායමේ සාමාජිකත්වය දැරීම.

### 1.2.3 2006 අංක 20 දරණ රබර් නැවත වගා කිරීමේ සහනාධාර ( සංශෝධිත ) පනතින් පැනවෙන සෙස් බදු නියෝග

1953 අංක 36 දරණ රබර් නැවත වගා අරමුදල් පනතේ 7 වන වගන්තිය අනුව අපනයන බදු අය කිරීමට නීතිමය ප්‍රතිපාදන සැලසී තිබිණ. මේ අනුව පිටරට යවනු ලැබූ සෑම රබර් රාත්තලක් සඳහාම ශත 10 ක මුදලක් අපනයන බදු ලෙස අය කර ගෙන ඇත.

2006 අංක 20 දරණ රබර් නැවත වගා කිරීමේ සහනාධාර (සංශෝධිත) පනතට අනුව , දේශීයව පරිභෝජනයට ගන්නා

- අමු ස්වභාවික රබර් හා
- කෘත්‍රිම රබර් මත

සෙස් බදු අය කිරීමට ප්‍රතිපාදන සලසා ඇත.

2007 අංක 01 දරණ සෙස් බදු නියෝග ක්‍රියාත්මක වීමට පෙර සෙස් බදු අය කරනු ලැබුවේ ආනයනය හා අපනයනය කරනු ලැබූ ස්වභාවික අමු රබර් හා රබර් ආශ්‍රිත භාණ්ඩ මතය.

2007 අංක 01 දරණ ස්වභාවික රබර් සඳහා වූ සෙස් බදු නියෝග ඇතුලත් 2007 අගෝස්තු 30 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1518/18 දරණ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව අපනයනය කිරීම සඳහා හෝ දේශීය පරිභෝජනය පිණිස නිෂ්පාදනය කරන ස්වභාවික රබර් ආශ්‍රිත නිෂ්පාදන සඳහා අවශ්‍ය අමු රබර් මත කිලෝ ග්‍රෑමයකට රු 4 ක සෙස් බද්දක් අය කිරීමට මෙමගින් ප්‍රතිපාදන සලසා දී ඇත.

මෙහිදී සෘජුවම මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉහත සෙස් බදු මුදල අයකර ගැනීමට බලතල හිමිවී ඇත.

ඒ අනුව ,

- ඉහත සෙස් බදු සෘජුවම අය කරගැනීම.
- කර්මාන්තකරුවන් , නිෂ්පාදකයින් සෙස් බදු සඳහා ලියාපදිංචි කර ගැනීම.
- බදු නොගෙවන්නන්ට හා ලියාපදිංචි නොවූවන්ට එරෙහිව නඩු පැවරීමට පියවර ගැනීම.

මෙමගින් සිදු වේ.

## 1.3 දෙපාර්තමේන්තුවේ ආයතනික සංයුතිය

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් වන මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය කොළඹ 02, වොක්ෂෝල් පටුමග, අංක 55/75 දරණ ස්ථානයේ පිහිටුවා ඇත. ප්‍රධාන කාර්යාලය විසින් පරිපාලන, මෙහෙයුම්, සෙස් බදු එක් රැස් කිරීම හා අනෙකුත් ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු සිදුකරයි. සහනාධාර ගෙවීම, පැල නිෂ්පාදනය කර බෙදා හැරීම, පොහොර බෙදා හැරීම හා උපදේශන සේවා වැනි රබර් වගාවේ සංවර්ධනය සඳහා ඉටු කරන සේවාවන් ජනතාව වෙත වඩාත් කාර්යක්ෂමව ලබා දීමේ අරමුණින් දෙපාර්තමේන්තුවේ කටයුතු විමධ්‍යගත කර ඇති අතර ඒ අනුව ප්‍රාදේශීය කාර්යාල 5ක් පිහිටුවා ඇත.

1. කෑගල්ල ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය

   (කෑගල්ල, කුරුණෑගල, මහනුවර, මාතලේ හා ගම්පහ දිස්ත්‍රික්ක සඳහා)

2. කළුතර ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය

   (කළුතර දිස්ත්‍රික්කය සඳහා)

3. රත්නපුර ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය

   (රත්නපුර හා කොළඹ දිස්ත්‍රික්ක සඳහා)

4. ගාල්ල ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය

   (ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක සඳහා)

5. මොණරාගල ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ කාර්යාලය

   (මොණරාගල, බදුල්ල හා අම්පාර දිස්ත්‍රික්ක සඳහා)

තවද රබර් වගාව සඳහා ගුණාත්මක බද්ධ රබර් පැල නිෂ්පාදනය සඳහා රජයේ පැල තවාන් 07ක් ස්ථාපනය කර ඇත.

1. මීරිගම (ගම්පහ දිස්ත්‍රික්කය)
2. වැලිකඩමුල්ල (ගම්පහ දිස්ත්‍රික්කය)
3. ඇගල් ඔය (කළුතර දිස්ත්‍රික්කය)
4. ගුරුගොඩ (කළුතර දිස්ත්‍රික්කය)
5. කරපිංච (රත්නපුර දිස්ත්‍රික්කය)
6. කුඹුක්කන (මොණරාගල දිස්ත්‍රික්කය)
7. මිද්දෙණිය (හම්බන්තොට දිස්ත්‍රික්කය)

### 1.3.1 ප්‍රධාන කාර්යාලයේ මූලික කාර්ය භාරය,

- ප්‍රධාන පනත් හා නෛතික මූලාශ්‍ර මගින් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම.
- ප්‍රාදේශීය කාර්යාල මගින් රබර් ඉඩම් සහ එහි හිමිකරුවන් ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබාදීම හා වගාව සඳහා පැල , පොහොර හා සහනාධාර මුදල් ලබාදීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- නැවත වගා සහ අළුත් වගා සහනාධාර ක්‍රම පරිපාලනය කිරීම හා ප්‍රාදේශීය කාර්යාල මගින් සහනාධාර ගෙවීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- වැවිලි සමාගම් සඳහා නැවත වගා බලපත්‍ර නිකුත් කිරීම.
- රජයේ තවාන් හා පෞද්ගලික රබර් පැල තවාන් මගින් උසස් වර්ගයේ රබර් පැල නිෂ්පාදනය කිරීම හා පැල නිෂ්පාදනයට පුද්ගලික අංශයට ආධාර සහ උපදෙස් සැපයීම.
- රබර් වෙළඳාම, රබර් ආශ්‍රිත නිෂ්පාදනය හා රබර් අපනයනය සඳහා බලපත්‍ර ලබා දීම.
- රබර් නිෂ්පාදනය කිරීම සඳහා කර්මාන්තශාලා නවීකරණය කිරීමට සහනාධාර ලබා දීම.
- රබර් වගා බිම් ප්‍රමාණය, නිෂ්පාදනය, දේශීය පරිභෝජනය හා අපනයනය යනාදී වැදගත් වන දත්ත හා තොරතුරු එක් රැස් කිරීම.
- රබර් වගාවේ දියුණුව සඳහා ගොවීන්ට උපදේශක සේවාවන් සැපයීම සහ ඔවුන්ට අවශ්‍ය කෘෂි යෙදවුම් ප්‍රවාහනය කර දීම.
- වෙළඳපල පිළිබඳව කුඩා රබර් හිමියන් දැනුවත් කිරීම.

- ස්වාභාවික රබර් නිෂ්පාදනය, පරිභෝජනය හා වෙළඳාම සම්බන්ධව අන්තර්ජාතික සංවිධාන සමග කටයුතු කිරීම.
- සෙස් අරමුදල් එකතු කිරීම හා පරිපාලනය.
- රබර් වගාවේ හා නිෂ්පාදනයේ ඒ ඒ අවධිවලට අදාලව කුඩා ඉඩම් හිමියන් වෙත අවශ්‍ය දැනුම හා උපදෙස් ලබාදීම.
- කුඩා ඉඩම් හිමියාගේ ආර්ථික උන්නතිය උදෙසා කටයුතු සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- රබර් අංශයේ ඵලදායිතාවය හා නිෂ්පාදනය ඉහළ නැංවීම අරමුණු කරගත් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා ප්‍රමුඛ ආයතනය ලෙස කටයුතු කිරීම.
- මහින්ද චින්තනය, ගම නැගුම, නැගෙනහිර නවෝදය, අපි වවමු රට නගමු වැනි රජයේ විශේෂ සංවර්ධන යෝජනා ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රාදේශීය කාර්යාල හා අමාත්‍යාංශය අතර සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- රබර් අංශට අදාල රාජ්‍ය ආදායම ඇස්තමේන්තු කිරීම, එක්රැස් කිරීම හා ගිණුම්කරණ කටයුතු කිරීම.

### 1.3.2 ප්‍රාදේශීය කාර්යාල මඟින් ඉටු කරන ප්‍රධාන සේවාවන් වන්නේ

- රබර් වගාව සඳහා ඉඩම් ලියාපදිංචි කිරීම.
- රබර් නැවත වගාව හා අළුත් වගාව සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම.
- තේ / රබර් මිශ්‍ර වගාව සඳහා අවසර පත් ලබා දීම.
- අතුරු භෝග සඳහා අවසර පත් නිකුත් කිරීම.
- අවසර පත් නිකුත් කල වගාකරුවන් සඳහා සහනාධාර ගෙවීම.
- රබර් වෙළඳසැල් සඳහා වෙළඳ බලපත්‍ර ලබා දීම.
- අපරිනත හා පරිනත රබර් වගාවන්ට පොහොර බෙදා හැරීම.
- රබර් වතු හිමියන්ගේ සමිති පවත්වා ගෙන යාමට සහය වීම.
- රජයේ රබර් පැල තවාන් පවත්වා ගෙන යාම හා පැල නිෂ්පාදනය.
- පුද්ගලික රබර් පැල තවාන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම හා අධීක්ෂණය කිරීම
- ගොවීන් හා වතු හිමියන් සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම.
- රබර් පැල බෙදා හැරීම.
- රබර් වගාවට වැළඳෙන රෝග සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය දැනුවත් කිරීම හා අවශ්‍ය පියවර ගැනීම.

- ගම නැගුම, මහින්ද චින්තනය, නැගෙනහිර නවෝදය, අපි වවමු රට නගමු වැනි රජයේ විශේෂ සංවර්ධන යෝජනා ක්‍රියාවට නැංවීම.
- තුරු සවිය අරමුදලේ කටයුතු සඳහා ක්‍රියාකාරී සහය ලබා දීම.

### 1.3.3 රජයේ තවාන්වල ප්‍රධාන කාර්යයන් වන්නේ;

1. ජාතික ඉලක්කයන් අරභයා,

- නැවත වගා හා අළුත් වගා පැල අවශ්‍යතාවය සඳහා අවශ්‍ය ප්‍රමිතියෙන් යුත් උසස් බද්ධ රබර් පැල රබර් පර්යේෂණායතනයේ නිර්දේශ වලට අනුකූලව නිෂ්පාදනය කර බෙදා හැරීම.
- ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ නව ක්ලෝන සොයා ගැනීම් ගොවීන්ට හඳුන්වා දීම.

2. තවාන්වල අනෙකුත් පරිපාලන කටයුතු කිරීම.

## 2. කාර්ය සාධන ප්‍රගතිය - 2012 වසර

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2012 වර්ෂයේ කාර්ය සාධනය පිළිබඳව සැලකීමේදී ඉහළ කාර්ය සාධනයක් තුලින් රබර් අංශයේ වාර්ෂික ඉලක්ක සපුරාගත් සුවිශේෂී වසරක් ලෙස සැලකිය හැකිය. එහිදී කාර්ය සාධනය වැඩි කර ගැනීම පිණිස දායක වූ විශේෂයෙන් කැපී පෙනෙන වැඩසටහන් ලෙස

- රබර් වගා සහනාධාර වැඩසටහන
- වැහි ආවරණ යෙදීමේ වැඩසටහන
- අතුරු භෝග වැඩසටහන
- පුහුණු වැඩසටහන්
- දිවි නැගුම ජාතික සංවර්ධන වැඩසටහන යන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

### 2.1 රබර් වගා සහනාධාර වැඩසටහන

රබර් නව වගා වැඩසටහන යටතේ හෙක් 3000 ක ඉලක්කයක් පැවති අතර ඉන් හෙක් 1269.633 ක්ද මොණරාගල දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 5000 ක් රබර් වගා කිරීමේ විශේෂ වැඩසටහන (IFAD) විදේශාධාර ව්‍යාපෘතිය මෙම වර්ෂයේද ක්‍රියාත්මක කරන ලද අතර ඒ මගින් හෙක් 1027 ක්ද වැවිලි
සමාගම් යටතේ හෙක් 179 ක් වගා කරන ලදී. මේ අනුව නව වගාව යටතේ වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙක් 2475.633 කි. රබර් නව වගාව සඳහා සහනාධාර වශයෙන් රු. මි. 144.23 වියදම් කරන ලදී.

රබර් නැවත වගා වැඩසටහන යටතේ කුඩා වතු සඳහා හෙක් 1800 ඉලක්කයක් පැවති අතර හෙක්ටයාර 1117.139 ක් වගා කරන ලදී. වැවිලි සමාගම් යටතේ හෙක් 1500 ඉලක්කයක් පැවති අතර හෙක් 1044 ක්ද වගා කරන ලදී. ඒ අනුව රබර් නැවත වගාව යටතේ වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙක් 2161.139 කි. රබර් නැවත වගා වැඩසටහන සඳහා සහනාධාර වශයෙන් රු. මි. 204.44 ක් වියදම් කරන ලදී.

### 2.2 වැහි ආවරණ යෙදීමේ වැඩසටහන

වැහි ආවරණ යෙදීමේ වැඩසටහන යටතේ කුඩා වතු සඳහා හෙක් 3400 ක ඉලක්කයක් පැවති අතර එයින් හෙක් 726.075 ක් සඳහා වැහි ආවරණ යොදන ලදී. කුඩා වතු සඳහා සහනාධාර වශයෙන් රු. මි. 7.67 ද වැවිලි සමාගම් සඳහා හෙක් 5480 ක ඉලක්කයක් පැවති අතර ඒ සඳහා ඇති දැඩි උනන්දුව මත හෙක් 5702.39 ක් සඳහා වැහි ආවරණ යෙදීමට සහනාධාර වශයෙන් රු. මි. 27.356 ක මුදලක් වැය කරන ලදී.

## 2.3 අතුරු භෝග වැඩසටහන

අපරිණත රබර් වගාව සමඟ රබර් වගා කරුවන්ට අතිරේක ආදායමක් ලබා ගැනීම සඳහා අතුරු භෝග වගා කිරීමේ වැඩසටහන යටතේ හෙක් 400 ක ඉලක්කයක් පැවති අතර එයින් හෙක් 262.54 ක් වගා කරන ලදී. අතුරු භෝග වැඩසටහන සඳහා සහනාධාර වශයෙන් රු. මි. 0.963 ක මුදලක් වියදම් කරන ලදී.

## 2.4 පුහුණු වැඩසටහන්

පුහුණු වැඩසටහන් වශයෙන් කිරි කැපුම් ශිල්පී පුහුණු වැඩසටහන සාමාන්‍ය, වෘත්තීය කිරිකැපුම් ශිල්පී පුහුණු වැඩසටහන හා බද්ධ කරුවන් පුහුණු කිරීම පවත්වන ලදී. කිරි කැපුම් ශිල්පීන් පුහුණු වැඩසටහන යටතේ සාමාන්‍ය කිරි කැපුම් ශිල්පීන් සඳහා ඉලක්කගත පුද්ගලයින් සංඛ්‍යාව 2400 වූ අතර එයින් 2320 දෙනෙකු පුහුණුව අවසන් කරන ලදී. කිරිකැපුම් ශිල්පී සාමාන්‍ය වැඩසටහන සඳහා රු.මි. 1.596 ක් වියදම් කරන ලදී. වෘත්තීය කිරි කැපුම් ශිල්පීන් සඳහා ඉලක්කගත පුද්ගලයින් සංඛ්‍යාව 300 වූ අතර එයින් 296 දෙනෙකු පුහුණු කරවන ලදී. වෘත්තීය කිරිකැපුම් ශිල්පී වැඩසටහන සඳහා රු.මි. 2.87 ක් වියදම් කරන ලදී. බද්ධකරුවන් පුහුණු කිරීම සඳහා ඉලක්කගත පුද්ගලයින් සංඛ්‍යාව 250 වූ අතර එයින් 218 දෙනෙකු පුහුණු කරවන ලදී. බද්ධකරුවන් පුහුණු වැඩසටහන සඳහා
රු. මි. 0.18 ක් වියදම් කරන ලදී.

## 2.5 දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන

1. මෙම වැඩසටහන යටතේ පාළු සිටුවීම සඳහා රබර් පැළ 100,000 ඉලක්කයක් පැවති අතර පැල 93177 ක් මොණරාගල, බදුල්ල, අම්පාර, හම්බන්තොට, වවුනියාව, පොළොන්නරුව යන දිස්ත්‍රික්ක වලට බෙදා දෙන ලදී. ඒ සඳහා රු. මි. 5.59 ක මුදලක් වැය කරන ලදී.

2. අපරිණත රබර් වගා බිම් වල අතුරු භෝග ලෙස වගා කිරීමට කෙසෙල් පැල හා අන්නාසි පැල නොමිලේ ලබා දෙන ලද ලදී. පැල ඉලක්කය 67,000 වූ අතර කෙසෙල් පැල 27451 හා අන්නාසි පැල 46955 වශයෙන් එකතුව පැල 74,406 ක් බෙදා දෙන ලදී. ඒ සඳහා වැය කල මුදල රු. මි. 1.92 කි.

3. කිරි කැපුම් ශිල්පී පුහුණුව වැඩසටහන් වලට සහභාගි වූවන් හට 50% සහනාධාර මත කිරි පිහි ලබාදීමේ වැඩසටහන යටතේ පුහුණුව සඳහා ඉලක්කගත පුද්ගලයින් සංඛ්‍යාව 2600 ක් වූ අතර පුහුණුව අවසන් කළ පුද්ගලයින් 2528 දෙනෙකුට කිරි පිහි බෙදා දෙන ලදී. ඒ සඳහා වැය කල මුදල රු. මි. 0.73 කි.

4. රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදන සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට 50%ක ආධාර මුදලක් ලබාදීමේ වැඩසටහන යටතේ රබර් නිමි භාණ්ඩ ආශ්‍රිත කර්මාන්තකරුවන් 5 දෙනෙකුට වාහන අමතර කොටස් සෑදීම, සපත්තු සෑදීම, රබර් බුෂ් වර්ග සෑදීම, රබර් ඇඹරීම වැනි කාර්යයන් කර ගැනීමට අවශ්‍ය යන්ත්‍ර මිලදී ගැනීම සඳහා රු. මි. 1.16 ක මුදලක් වියදම් කරන ලදී.

# 3. ස්වභාවික රබර් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු - 2012 වසර

## 3.1 රබර් වගා බිම් ප්‍රමාණය

වාර්ෂිකව රබර් වගා බිම් ප්‍රමාණයේ වර්ධනයක් පෙන්නුම් කෙරේ. 2012 වර්ෂයේ දිවයිනෙහි ඇස්තමේන්තු ගත මුළු රබර් බිම් ප්‍රමාණය 2010 වර්ෂයේ පවත්වන ලද රබර් ඉඩම් සංගණනයේ ප්‍රතිඵල පදනම් කොට ගණනය කර ඇත.

**රබර් වගා බිම් ප්‍රමාණය- 2012 වර්ෂය**

| | පෞද්ගලික අංශය (හෙක්ටයාර් 20 ට අඩු ඉඩම්) හෙක් | ප්‍රාදේශිය වැවිලි සමාගම් (හෙක්ටයාර් 20 ට වැඩි ඉඩම්) හෙක් | එකතුව හෙක් |
|---|---|---|---|
| 2010 වර්ෂයේ රබර් ඉඩම් සංගණනයෙන් වාර්තා වු බිම් ප්‍රමාණය | 79395 | 46250 | 125645 |
| 2011 වර්ෂයේ ඇස්තමේන්තු ගත බිම් ප්‍රමාණය | 80018 | 48516 | 128534 |
| 2012 වර්ෂයේ ඇස්තමේන්තු ගත බිම් ප්‍රමාණය | 82170 | 48610 | 130780 |

**සංඛ්‍යා සටහන i**

රබර් වගාව පවතින බිම් ප්‍රමාණයෙන් 62.83% ක් කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ඉඩම් කට්ටි වශයෙන්ද, ඉතිරි ප්‍රමාණය වැවිලි සමාගම් වතු වශයෙන්ද පවතී. මෙම බිම් ප්‍රමාණයෙන් අපරිනත බිම් ප්‍රමාණය හෙක්ටයාර් 26580 ක්ද, කිරි කපන පරිනත බිම් ප්‍රමාණය හෙක්ටයාර් 104200 ක්ද ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එම වගාවෙන් ලත් මුළු නිෂ්පාදන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 152049 ක් වේ. 2012 වර්ෂයේ රබර් හෙක්ටයාරයක සාමාන්‍ය වාර්ෂික අස්වැන්න වියලි රබර් කිලෝ ග්‍රෑම් 1459 ක් ලෙසද ඇස්තමේන්තු කර ඇත.

## 3.2 නිෂ්පාදනය හා නිෂ්පාදන වියදම

### 3.2.1 නිෂ්පාදනය

2012 වර්ෂයේ මුළු රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 152049 කි. එය පෙර වර්ෂයේ මුළු නිෂ්පාදනය වන මෙට්‍රික් ටොන් 158198 ක ප්‍රමාණය හා සසඳන කල 3.9% ක අඩුවීමක් පෙන්නුම් කරයි. මෙලෙස නිෂ්පාදනය අඩු වීමට බල පෑ ප්‍රධාන හේතුවක් වන්නේ 2011 වර්ෂයට සාපේක්ෂව රබර් මිල පහල යාම වේ.

**2012 වර්ෂයේ මුළු රබර් නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)**

| වර්ෂය | ෂීට් රබර් | ස්ක්‍රැප් ක්‍රේප් | සෝල් ක්‍රේප් | ලේටෙක්ස් ක්‍රේප් | බ්ලොක් රබර් T.S.R | ලේටෙක්ස් සහ වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2011 | 60699 | 1332 | 3384 | 59933 | 7981 | 24869 | 158198 |
| 2012 | 59242 | 1280 | 1902 | 36550 | 8672 | 44403 | 152049 |

**සංඛ්‍යා සටහන ii**

### 3.2.2 නිෂ්පාදන වියදම

වියලි රබර් කිලෝ ග්‍රෑමයක් නිෂ්පාදනය සඳහා 2012 වර්ෂයේ පුද්ගලික අංශයේ සාමාන්‍ය නිෂ්පාදන වියදම රු. 136.00 කි. එය පෙර වර්ෂයේ නිෂ්පාදන වියදම වූ රු. 129.56 හා සසඳා බැලීමේදී, රු 4.97 ක වැඩි වීමක් පෙන්නුම් කරයි. නිෂ්පාදන වියදම 2002 වසරේ සිට වර්ධනය වී ඇති ආකාරය සංඛ්‍යා සටහන් අංක **iii** හි දක්වා ඇත.

**රබර් නිෂ්පාදන වියදම**

*(කි.ග්‍රෑම්1 ක්/රුපියල්)*

| වර්ෂය | වැවිලි සමාගම් | පුද්ගලික අංශය |
|---|---|---|
| 2002 | 55.74 | 54.00 |
| 2003 | 59.76 | 63.30 |
| 2004 | 65.98 | 73.37 |
| 2005 | 72.56 | 77.37 |
| 2006 | 87.65 | 97.20 |
| 2007 | 102.31 | 112.69 |
| 2008 | 119.89 | 114.00 |
| 2009 | 135.83 | 118.56 |
| 2010 | 158.94 | 119.83 |
| 2011 | 188.23 | 129.56 |
| 2012 | 207.00 | 136.00 |

**සංඛ්‍යා සටහන iii**

## 3.3 දේශීය රබර් පරිභෝජනය

මෙරට නිෂ්පාදිත ස්වභාවික රබර් අතීතයේ දි ප්‍රධාන වශයෙන් අපනයනය පදනම් වූ වැදගත් කාර්මික අමු ද්‍රව්‍යයක් ලෙස පැවති අතර, වර්තමානය වන විට එම තත්ත්වය ක්‍රමිකව වෙනස් වී දේශිය නිමි භාණ්ඩ නිෂ්පාදනය සඳහා වැඩි වශයෙන් රබර් භාවිතා කිරීමේ නැඹුරුතාවයක් දැක ගත හැකිය. ඒ අනුව 2012 වර්ෂයේදී දේශීය පරිභෝජනය ස්වභාවික රබර් මෙට්‍රික් ටොන් 110038 විය. මෙම ප්‍රමාණය 2012 වර්ෂයේ මුළු රබර් නිෂ්පාදනය වූ මෙට්‍රික් ටොන් 152049 න් 72% කි.

එකිනෙක නිෂ්පාදන වර්ගයන් සහ නිෂ්පාදන භාණ්ඩ අනුව අමු රබර් භාවිතය ප්‍රතිශතයක් ලෙස පහත දැක්වේ.

**නිමි භාණ්ඩ සඳහා අමු රබර් පරිභෝජනයේ ප්‍රතිශතය - 2012**

| නිමි භාණ්ඩ වර්ගය | නිෂ්පාදන භාණ්ඩ අනුව රබර් භාවිතය ප්‍රතිශතය ( % ) |
|---|---|
| ටයර් නිපදවීම | 37.6 |
| ටයර් නැවත පිරවීම | 17.0 |
| බැලූන් හා අත්වැසුම් | 42.0 |
| පාවහන් අමතර කොටස් | 0.4 |
| ගෘහ භාණ්ඩ උපකරණ | 0.3 |
| මෝටර් රථ අමතර කොටස් | 0.7 |
| වෙනත් | 2.0 |
| **එකතුව** | **100** |

**සංඛ්‍යා සටහන iv**

## 3.4 අපනයනය

2011 සහ 2012 වර්ෂයන්හි ලංකාවේ රබර් අපනයනය සංඛ්‍යා සටහන **v** හි දැක්වේ.

**2011 සහ 2012 වර්ෂයන්හි ශ්‍රී ලංකාවේ අපනයනය කළ රබර් ප්‍රමාණයන්**

| මාසය | නැව්ගත කළ ප්‍රමාණයන් **(මෙට්‍රික් ටොන්)** | |
|---|---|---|
| | 2011 වර්ෂය | 2012 වර්ෂය |
| ජනවාරි | 4590.7 | 4053 |
| පෙබරවාරි | 4958.6 | 4940 |
| මාර්තු | 4503.4 | 5994 |
| අප්‍රේල් | 4131.4 | 3524 |
| මැයි | 2381.4 | 2342 |
| ජූනි | 2151.1 | 1731 |
| ජූලි | 2838.3 | 1391 |
| අගෝස්තු | 4524.4 | 1778 |
| සැප්තැම්බර් | 3438.7 | 2988 |
| ඔක්තෝබර් | 3312.6 | 2637 |
| නොවැම්බර් | 2285.6 | 2470 |
| දෙසැම්බර් | 3489.8 | 3529 |
| **එකතුව** | **42606** | **37377** |

**සංඛ්‍යා සටහන v**

2011 සහ 2012 වර්ෂයන්හි ශ්‍රී ලංකාවේ අපනයනය කළ රබර් ප්‍රමාණයන් වර්ග අනුව පහත සටහනේ දක්වා ඇත.

**2011 සහ 2012 වර්ෂයන්හි අපනයනය කළ රබර් ප්‍රමාණයන් වර්ග අනුව**

**(මෙට්‍රික් ටොන්)**

| වර්ෂය | ෂීට් රබර් | සෝල් ක්‍රේප් | ස්ක්‍රැප් ක්‍රේප් | ලේටෙක්ස් ක්‍රේප් | බ්ලොක් රබර් (T.S.R) | ලේටෙක්ස් සහ වෙනත් | **එකතුව** |
|---|---|---|---|---|---|---|---|
| 2011 | 13561 | 2471 | - | 20904 | 3656 | 2014 | 42606 |
| 2012 | 11235 | 1401 | - | 17431 | 4669 | 2641 | 37377 |

**සංඛ්‍යා සටහන vi**

මුළු අපනයන රබර් ප්‍රමාණයන්හි නැ.වි.ස (F.O.B) වටිනාකම සටහන **vii** හි දැක්වේ.

**මුළු අපනයන රබර් ප්‍රමාණයන්හි නැ.වි.ස වටිනාකම**

**(රුපියල් මිලියන)**

| වර්ෂය | අපනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් | මුළු වටිනාකම රු.මිලියන | කි.ග්‍රෑම්1 ක වටිනාකම රු ශත |
|---|---|---|---|
| 2011 | 42606 | 22811.26 | 535.40 |
| 2012 | 37377 | 15726.00 | 421.00 |

**සංඛ්‍යා සටහන vii**

රබර් අපනයනය ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශය විසින් කරනු ලබයි. පෞද්ගලික අංශයෙහි ලියාපදිංචි අපනයන කරුවන් 102 දෙනෙකු සිටී. එම අපනයනකරුවන් 102 දෙනාම මෙම දෙපාර්තමේන්තුවේ 2012 වර්ෂය සඳහා ද ලියාපදිංචි කර ඇත.

**රබර් මිලයට ගන්නා ප්‍රධාන රටවල් 2012**

**(මෙට්‍රික් ටොන්)**

| රට | මිලයට ගත් ප්‍රමාණය | % |
|---|---|---|
| මලයාසියාව | 11640 | 31 |
| පාකිස්ථානය | 5382 | 14 |
| ඉන්දියාව | 5792 | 16 |
| ඇමරිකාව | 1723 | 5 |
| ජර්මනිය | 1951 | 5 |
| ජපානය | 1413 | 4 |
| ඉතාලිය | 1267 | 3 |
| චීනය | 722 | 2 |
| දකුණු අප්‍රිකාව | 476 | 1 |
| ස්පාඤ්ඤය | 191 | 1 |
| එක්සත් රාජධානිය | 388 | 1 |
| වෙනත් රටවල් | 6432 | 17 |
| **එකතුව** | **37377** | 100 |

**සංඛ්‍යා සටහන viii**

## 3.5 රබර් මිල

2011 හා 2012 වර්ෂ වල රබර් මිල පහත පරිදි වේ.

**වර්ග උනුව සාමාන්‍ය මිල**

***(කිලෝ 1ක් රුපියල්)***

| **වර්ෂය** | **වාර්ෂික සාමාන්‍ය මිල** | | |
|---|---|---|---|
| | **ෂීට් රබර් නො. 1** | **ස්ක්‍රැප් ක්‍රේප් නො.1.XBR** | **ලේටෙක්ස් ක්‍රේප් නො.1X** |
| 2011 | 513.05 | 461.83 | 575.65 |
| 2012 | 416.61 | 377.09 | 410.84 |

**සංඛ්‍යා සටහන ix**

### 3.6 රබර් අංශයේ සේවක වැටුප්

පැල තවාන්වල නියැලී සිටින සේවකයන්ට 2011 වර්ෂයේ ජුලි මස සිට වැටුප් වැඩි වීමක් ලබා දෙන ලදී. ඒ අනුව ගෙවන ලද මූලික දෛනික වැටුප වැඩිහිටියෙකුට රු: 380/- ක් විය. මීට අමතරව මාසය තුල 80% ක පැමිණීමක් ඇති සේවකයන්ට එක් දිනක් සඳහා රු. 220/- ක ගෙවීමක්ද, කරනු ලැබීය. පඩි පාලක සභා නිර්දේශය පරිදි වැඩි කර ක්‍රියාත්මක කළ ඉහත වැටුප් හා දිරි ගැන්වීම් නිසා තවාන් සේවකයන්ගේ පැමිණීම හා කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට හැකි විය.

### 3.7 රබර් වැවිලි ද්‍රව්‍ය අපනයනය

මෙම වර්ෂය තුළ රබර් වැවිලි ද්‍රව්‍ය අපනයන සඳහා බලපත්‍ර නිකුත් කර නැත.

### 3.8 රබර් වෙළඳුන්

2012 වර්ෂයේ රබර් වෙළඳුන් 1141 ක් සඳහා බලපත්‍ර නිකුත් කර ඇති දිස්ත්‍රික්ක වශයෙන් එම වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම් මෙසේය.

| දිස්ත්‍රික්කය | අලුත් කළ බලපත්‍ර සංඛ්‍යාව | අලුතින් නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|
| කොළඹ | 48 | 06 |
| ගම්පහ | 08 | 0 |
| කළුතර | 307 | 67 |
| රත්නපුර | 259 | 36 |
| කෑගල්ල | 362 | 46 |
| මහනුවර | 09 | 0 |
| මාතලේ | 24 | 0 |
| ගාල්ල | 76 | 06 |
| මාතර | 32 | 01 |
| මොණරාගල | 16 | 04 |
| එකතුව | **1141** | **166** |

**සංඛ්‍යා සටහන x**

### 3.9 රබර් නැවත වගා / අළුත් වගා සහනාධාර ක්‍රමය

සහනාධාර ක්‍රමය යටතේ රබර් නැවත හෝ අළුතෙන් වගා කිරීම සඳහා 1953 අංක 36 දරණ රබර් නැවත වගා කිරීමේ පනතේ 07 වගන්තිය අනුව අවසර පත්‍රයක් ලබාගත යුතුය. මෙම පනත අනුව සියලුම රබර් ඉඩම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතුය. ලියාපදිංචි වූ රබර් ඉඩමක පවතින වගාවේ වයස අවු 20 ඉක්ම වූ පසු එම ඉඩම සහනාධාර ක්‍රමය යටතේ නැවත වගා කිරීම සඳහා බලපත්‍රයක් ලැබීමට සුදුසුකම් ලබයි.

රබර් වගාවේ නිරත වන්නන් තව දුරටත් දිරි ගැන්වීම සඳහා හෙක්ටයාරයකට රු. 125000 ක් වූ නැවත වගා/ අළුත් වගා සහනාධාර මුදල 2011 වසරේදී පහත පරිදි වැඩි කරන ලදී.
අළුත් වගාව සඳහා හෙක්ටයාරයකට රු. 150000
නැවත වගාව සඳහා හෙක්ටයාරයකට රු. 175000

මෙම ආධාර මුදල වාරික 08 කින් ගෙවනු ලැබේ.

### 3.10 "මහින්ද චින්තනය" ක්‍රියාත්මක කිරීම හා නව වගාවද ඇතුලත්ව රබර් වගා කිරීමේ ප්‍රගතිය

මෙරට රබර් කර්මාන්තය ශක්තිමත් ආර්ථික ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යාම සඳහා වයස්ගත වූ, කල් ඉක්මවූ හා ආර්ථික වශයෙන් ඵලදායී නොවන රබර් වගාවන් ඉවත්කොට එම ඉඩම් නැවත වගා කළ යුතු වේ. ඵලදායී වගාවක් පවත්වාගෙන යාම සඳහා මුළු රබර් බිම් ප්‍රමාණයෙන් 3% ක් වත් වාර්ෂිකව නැවත වගා කළ යුතු වේ. එම බිම් ප්‍රමාණය දළ වශයෙන් හෙක්ටයාර් 3900 වේ. 2012 වර්ෂයේ ඇස්තමේන්තු ගත නැවත වගා/ අළුත් වගා රබර් බිම් ප්‍රමාණය හෙක්ටයාර් 6300 විය. 2012 වර්ෂයට නැවත වගා කිරීම සඳහා ඉලක්ක බිම් ප්‍රමාණය පුද්ගලික අංශයේ හෙක්ටයාර් 1800 සහ රාජ්‍ය වතු අංශයේ හෙක්ටයාර් 1500 ක්ද වශයෙන් හෙක්ටයාර් 3300 කි. වර්ෂය තුල අළුත් වගා ඉලක්කය පෞද්ගලික අංශයේ සම්ප්‍රදායික ප්‍රදේශ වල හෙක්ටයාර් 1750 සහ සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල හෙක්ටයාර් 1250 ක්ද වශයෙන් හෙක්ටයාර් 3000 කි.

නැවත වගා හා අළුත් වගා සහනාධාර ක්‍රමයන් යටතේ වගා කිරීම සඳහා ලැබුණු ඉල්ලුම් පත්‍ර, නිකුත්කල බලපත්‍ර හා නියම වශයෙන් වගා කරන ලද බිම් ප්‍රමාණයන් සංඛ්‍යා සටහන් xi හා xii හි සඳහන් වේ.

**රබර් නැවත වගා සහනාධාර ක්‍රමය යටතේ නැවත වගා කළ බිම් ප්‍රමාණය (කුඩා වතු හිමියන්) 2012 වර්ෂය**

*(හෙක්ටයාර්)*

| දිස්ත්‍රික්කය | ලද අයදුම් පත්‍ර | | නිකුත් කළ බලපත්‍ර | | නැවත වගාකළ බිම් ප්‍රමාණය | |
|---|---|---|---|---|---|---|
| | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) |
| කළුතර | 1049 | 614.770 | 992 | 597 | 459 | 288.670 |
| කෑගල්ල | 1275 | 798.530 | 1003 | 614.69 | 609 | 355.190 |
| ගම්පහ | 179 | 120.150 | 137 | 95.31 | 103 | 73.160 |
| කුරුණෑගල | 45 | 74.670 | 41 | 47.79 | 32 | 32.880 |
| මහනුවර | 105 | 99.500 | 50 | 25.85 | 34 | 14.140 |
| මාතලේ | 23 | 63.000 | 10 | 34.72 | - | 2.024 |
| රත්නපුර | 625 | 445.130 | 558 | 380.55 | 275 | 198.412 |
| ගාල්ල | 66 | 69.933 | 63 | 56.402 | 34 | 32.392 |
| මාතර | 68 | 49.068 | 37 | 44.437 | 28 | 32.621 |
| මොණරාගල | 04 | 2.830 | 04 | 2.83 | 04 | 2.830 |
| කොළඹ | 240 | 160.010 | 204 | 139.312 | 124 | 84.820 |
| **එකතුව** | **3679** | **2497.591** | **3099** | **2038.891** | **1702.0** | **1117.139** |

**සංඛ්‍යා සටහන xi**

**රබර් අළුත් වගා සහනාධාර ක්‍රමය යටතේ වගා කළ බිම් ප්‍රමාණය (කුඩා වතු හිමියන්) 2012**

***(හෙක්ටයාර්)***

| දිස්ත්‍රික්කය | ලද අයදුම් පත්‍ර | | නිකුත් කළ බලපත්‍ර | | අළුතින් වගා කළ බිම් ප්‍රමාණය | |
|---|---|---|---|---|---|---|
| | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) |
| කළුතර | 764 | 357.870 | 715 | 329.990 | 307 | 145.160 |
| කෑගල්ල | 1397 | 639.940 | 1164 | 508.380 | 667 | 279.920 |
| ගම්පහ | 230 | 126.000 | 178 | 91.980 | 125 | 66.990 |
| කුරුණෑගල | 137 | 93.580 | 90 | 68.350 | 46 | 38.360 |
| මහනුවර | 78 | 69.960 | 46 | 24.620 | 21 | 11.270 |
| මාතලේ | 44 | 74.150 | 24 | 34.380 | - | 11.330 |
| රත්නපුර | 1012 | 646.020 | 749 | 441.180 | 393 | 254.019 |
| ගාල්ල | 364 | 209.116 | 273 | 168.889 | 79 | 61.097 |
| මාතර | 362 | 189.910 | 318 | 170.026 | 191 | 92.453 |
| හම්බන්තොට | 163 | 94.766 | 156 | 88.691 | 48 | 26.102 |
| කොළඹ | 227 | 129.590 | 182 | 78.908 | 105 | 57.822 |
| මොණරාගල | 558 | 345.640 | 329 | 204.780 | 93 | 48.510 |
| බදුල්ල | 248 | 153.460 | 198 | 113.110 | 58 | 39.100 |
| අම්පාර | 755 | 435.750 | 738 | 422.500 | 241 | 137.500 |
| **එකතුව** | **6339** | **3565.752** | **5160** | **2745.784** | **2374** | **1269.633** |

**සංඛ්‍යා සටහන xii**

## රබර් නැවත වගා බිම් ප්‍රමාණය 1990-2012

(හෙක්ටයාර්)

| වර්ෂය | පෞද්ගලික අංශය | වැවිලි සමාගම් | එකතුව |
|---|---|---|---|
| 1990 | 3584 | 1617 | 5201 |
| 1991 | 3507 | 1794 | 5301 |
| 1992 | 2028 | 1889 | 3917 |
| 1993 | 2419 | 2817 | 5236 |
| 1994 | 1623 | 2138 | 3761 |
| 1995 | 1778 | 1461 | 3239 |
| 1996 | 1983 | 1217 | 3200 |
| 1997 | 1172 | 2045 | 3217 |
| 1998 | 1173 | 2542 | 3715 |
| 1999 | 665 | 3866 | 4531 |
| 2000 | 770 | 1853 | 2623 |
| 2001 | 558 | 4584 | 5142 |
| 2002 | 712 | 2066 | 2778 |
| 2003 | 565 | 494 | 1059 |
| 2004 | 819 | 1264 | 2083 |
| 2005 | 1257 | 2329 | 3586 |
| 2006 | 1122 | 2331 | 3453 |
| 2007 | 993 | 4199 | 5192 |
| 2008 | 812 | 5293 | 6105 |
| 2009 | 1002 | 5360 | 6362 |
| 2010 | 1186 | 4755 | 5941 |
| 2011 | 1123 | 1927 | 3050 |
| 2012 | 1117 | 1044 | 2161 |

**සංඛ්‍යා සටහන xiii**

රබර් නව වගා බිම් ප්‍රමාණය 1990-2012

(හෙක්ටයාර්)

| වර්ෂය | පෞද්ගලික අංශය | වැවිලි සමාගම් | එකතුව |
|---|---|---|---|
| 1990 | 1039 | 258 | 1297 |
| 1991 | 1602 | 202 | 1804 |
| 1992 | 612 | 302 | 914 |
| 1993 | 907 | 135 | 1042 |
| 1994 | 670 | 37 | 707 |
| 1995 | 651 | 45 | 696 |
| 1996 | 1208 | 35 | 1243 |
| 1997 | 793 | 21 | 814 |
| 1998 | 516 | 17 | 533 |
| 1999 | 223 | 48 | 271 |
| 2000 | 243 | 34 | 277 |
| 2001 | 150 | 14 | 164 |
| 2002 | 227 | 7 | 234 |
| 2003 | 451 | 7 | 458 |
| 2004 | 518 | 5 | 523 |
| 2005 | 1032 | 11 | 1043 |
| 2006 | 1603 | 297 | 1900 |
| 2007 | 1701 | 333 | 2034 |
| 2008 | 2130 | 414 | 2544 |
| 2009 | 715 | 74 | 789 |
| 2010 | 1317 | 96 | 1413 |
| 2011 | 2166 | 838 | 3004 |
| 2012 | 2297 | 179 | 2476 |

**සංඛ්‍යා සටහන xiv**

## 3.11 විදේශාධාර [ IFAD] මත ක්‍රියාත්මක වන මොණරාගල විශේෂ වැඩසටහන

**කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන**

මොණරාගල දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 5000 ක් වගා කිරීමේ විශේෂ වැඩසටහනේ වගා කටයුතු මෙම වර්ෂයේ ද ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල, බඩල්කුඹුර, මොණරාගල, මඩුල්ල සහ මැදගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මෙම වසරේ හෙක්ටයාර් 1027 වගා කරන ලදී.

## 3.12 රබර් පැළ තවාන් සහ පැල සැපයීම්

දිනෙන් දින ඉහළ යන රබර් මිල නිසා රබර් වගාව කෙරේ වැවිලි කරුවන්ගේ උනන්දුව අධික විය. මේ නිසා රබර් පැල ඉල්ලුම නොකඩවා ඉහළ ගියේය. මේ සඳහා පැළ නිෂ්පාදනයට විශේෂ අවධානයක් දෙපාර්තමේන්තුව විසින් යොමු කෙරිණි.

පුද්ගලික රබර් පැළ තවාන් හා වාණිජ රබර් පැල තවාන් පිහිටුවීම සඳහා දෙපාර්තමේන්තුවෙන් අවසර පත්‍රයක් ලබා ගත යුතුය. මූලික අවස්ථාවේදී මෙම තවාන් වල උසස් තත්වයේ බද්ධ අතු තවාන් පිහිටුවා ගැනීම සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය දෙපාර්තමේන්තුව සතු තවාන් වලින් සපයනු ලබයි.

### 3.12.1 පුද්ගලික සහ වාණිජ තවාන් බලපත්‍ර 2012

ස්වභාවික රබර් සඳහා පසුගිය වසර කිහිපය පුරාම ස්ථාවර ආකර්ශණීය මිලක් ලැබීම නිසා 2012 වසරේදී ද රබර් වගාව පිළිබඳව වැවිලි කරුවන්ගේ තිබූ උනන්දුව හා ඉල්ලුම ඉහල අගයක පැවතුනි. මෙම ඉල්ලුමට අවශ්‍ය පැල නිෂ්පාදනයේ වැඩි වගකීමක් පැවරුනේ මෙම දෙපාර්තමේන්තුව වෙතයි පුද්ගලික අංශයේ තවාන්ද පැල නිෂ්පාදනයේදී දායකත්වයක් ලබාදෙන ලදී.

උසස් තත්වයේ බද්ධ රබර් පැල වැවිලිකරුවන්ට ලබාදීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වේ. දෙපාර්තමේන්තු තවාන්වල පැල නිෂ්පාදන ධාරිතාවය වැඩිකිරීම පැලවල ගුණාත්මක බව වැඩි දියුණු කිරීම හා තවාන් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ අරමුණින් තවාන් සංවර්ධන කටයුතු රාශියක් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. පුද්ගලික අංශයේ තවාන් ද උසස් පැල නිෂ්පාදනය සඳහා යොමු කිරීම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයකි. නිර්දේශිත ආකාරයට පිහිටුවා ඇති පැල තවාන් සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි. බලපත්‍ර නිකුත් කල පුද්ගලික පැල තවාන් රබර් පර්යේෂණායතනයේ නිරන්තර අධීක්ෂණයට ලක් වන අතර පැල තවාන් නිර්දේශිත ආකාරයට පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපදෙස් ද ලබාදේ. මෙම පැල තවාන් නිර්දේශිත ආකාරයට පවත්වාගෙන යන්නේ දැයි පසු විපරම් කිරීම රබර් සංවර්ධන නිලධාරීන් විසින් සිදු කරනු ලබයි.

**රජයේ තවාන් වල පැල නිෂ්පාදනය හා පැල නිකුත් කිරීම-2012**

| තවානේ නම | දිස්ත්‍රික්කය | පැල නිෂ්පාදනය |
|---|---|---|
| කරපිංච | රත්නපුර | 102109 |
| මීරිගම | ගම්පහ | 346692 |
| වැලිකඩමුල්ල | ගම්පහ | 417287 |
| ඇගල්ඔය | කළුතර | 306705 |
| කුඹුක්කන | මොණරාගල | 413038 |
| ගුරුගොඩ | කළුතර | 310460 |
| මිද්දෙණිය | හම්බන්තොට | 105081 |
| **එකතුව** | | **2001372** |

**සංඛ්‍යා සටහන xv**

2012 වසරේදී දෙපාර්තමේන්තු පැල තවාන් වල අපේක්ෂිත පැල නිෂ්පාදනය මිලියන 2.2 කි. වසරේ මුළු පැල නිෂ්පාදනය මිලියන 2 වූ අතර වසර තුල බෙදා හැරීමට හැකි වූයේ පැල මිලියන 1.36 ක් පමණි.

**පැල නිෂ්පාදනය ( පුද්ගලික පැල තවාන්) 2012**

| ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශය | ලියාපදිංචි තවාන් ගණන | පැල බෙදාහැරීම |
|---|---|---|
| කෑගල්ල | 12 | 561774 |
| කළුතර | 05 | 85740 |
| මොණරාගල | 38 | 609498 |
| ගාල්ල | 20 | 44189 |
| රත්නපුර | 08 | 568214 |
| **එකතුව** | **83** | **1869415** |

**සංඛ්‍යා සටහන xvi**

දෙපාර්තමේන්තු පැල තවාන් වලින් මෙන්ම පුද්ගලික අංශයේ  තවාන් වලින්ද වැඩි වශයෙන් නිකුත් කලේ RRIC 121 ක්ලෝනය වන අතර පෙර වසරට සාපේක්ෂව RRISL 203 ක්ලෝනය නිෂ්පාදනය වැඩි වී තිබුණි.

### 3.13 අතුරු භෝග වගාව

2006 වර්ෂයේ සිට රබර් සමග අතුරු භෝග වගා කරන කුඩා ඉඩම් හිමියන් සඳහා රබර් පර්යේෂණායතනයේ නිර්දේශ මත අක්කරයකට රු 4000.00 බැගින් සහනාධාර ගෙවීම මෙම දෙපාර්තමේන්තුව මගින් මේ දක්වාම කරනු ලබයි. 2006 හා 2007 වර්ෂවල මෙම සහනාධාර ගෙවනු ලැබුවේ කෙසෙල් වගාව සඳහා පමණි.

2008 වර්ෂයේ සිට අන්නාසි වගාව සඳහා ද ඉහත පදනම මත සහනාධාර ගෙවීම ආරම්භ කරන ලදී. 2011 වසරේ දී වැල් දොඩම් ද මෙම සහනාධාර ක්‍රමයට ඇතුලත් කර ගන්නා ලදී 2012 වර්ෂයේ දී අතුරු භෝග සහනාධාර වශයෙන් රු.963000 ක මුදලක් ගෙවන ලදී.

**2012 වර්ෂයේ අතුරුබෝග වගාකල බිම් ප්‍රමාණය**

| දිස්ත්‍රික්කය | වගාකල බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) |
|---|---|
| කෑගල්ල | 59.330 |
| ගම්පහ | 45.790 |
| කුරුණෑගල | 7.070 |
| මහනුවර | 5.500 |
| කළුතර | 38.240 |
| රත්නපුර | 16.774 |
| කොළඹ | 20.786 |
| ගාල්ල | 8.370 |
| මාතර | 10.375 |
| හම්බන්තොට | 24.560 |
| මොණරාගල | 3.740 |
| **එකතුව** | **240.535** |

**සංඛ්‍යා සටහන xvii**

### 3.14 වැහි ආවරණ භාවිතය ප්‍රචලිත කිරීම

2011 වසරේ අයවැය යෝජනා අනුව පරිනත රබර් වගා ඉඩම් වල ඵලදායීතාවය ඉහල නැංවීම සඳහා රබර් වගාකරුවන් වැහි ආවරණ භාවිතයට උනන්දු කිරීම උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. සාර්ථක වැහි ආවරණ යොදා ඇති ගසකට ඒ සඳහා වැයවන මුදලින් 50% එනම් රු. 30 ක මුදලක් සහනාධාර වශයෙන් ගෙවනු ලබයි.

කුඩා වතු හා වැවිලි සමාගම් සඳහා මේ යටතේ සහනාධාර ගෙවීම් කරන ලදී මෙම වැඩසටහනේ ප්‍රගතිය පහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**වැහි ආවරණ යෙදීම**

| අංශය | වැහි ආවරණ යෙදූ බිම් ප්‍රමාණය (හෙක්.) | සහනාධාර වශයෙන් ගෙවූ මුදල රු. මි. |
|---|---|---|
| කුඩා වතු | 726.075 | 7.67 |
| වැවිලි සමාගම් | 5702.39 | 27.356 |
| එකතුව | 6428.465 | 35.026 |

**සංඛ්‍යා සටහන xviii**

## 3.15 තේ, රබර් සහ පොල් ඉඩම් කැබලි කිරීම පාලනය කිරීමේ මණ්ඩලයේ කටයුතු

(i) 1958 අංක 02 දරණ තේ හා රබර් වතු (කැබලි කිරීම පාලනය කිරීමේ) පණත යටතේ ඉඩම් කැබලි කිරීම පාලනය කිරීමේ මණ්ඩලයක් පිහිටුවනු ලැබ ඇත. හෙක්ටයාර 20 ට වැඩි රබර් වත්තක් හෝ ඉන් කොටසක් කැබලි කැඩීමට හෝ විකිණීමට අවශ්‍ය වූ විට එම මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු වේ. මෙහිදී එම ආයතනයෙන් ලැබුනු අයදුම්පත්‍ර සඳහා මැනවින් සුපරීක්ෂණය කර ඉහත කී මණ්ඩලය වෙත නිර්දේශ යවනු ලැබීයි වර්ෂය තුල යවන ලද නිර්දේශ ගණන පහකට සීමා විය.

(ii) මෙම මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ගරු අමාත්‍යවරයා විසින් කරන ලද පත්වීම ප්‍රකාර පැවරුන රාජකාරි ඉටු කරන ලදී.

### 3.16 ජාත්‍යන්තර සංවිධානවල සාමාජිකත්වය

ශ්‍රී ලංකාව **ජාත්‍යන්තර රබර් අධ්‍යයන කණ්ඩායමේ (IRSG)** හා **ස්වභාවික රබර් නිපදවන රටවල සංගමයේ (ANRPC)** සාමාජිකත්වය දරයි ඒ සඳහා 2012 වර්ෂයේ සාමාජික මුදල වශයෙන් ස්වභාවික රබර් නිපදවන රටවල සංගමයට රු. 947692.79 ක් ද ජාත්‍යන්තර රබර් අධ්‍යයන කණ්ඩායමට
රු. 5645358.67ක් ද ගෙවා ඇත.

මෙම ආයතනවල සාමාජිකත්වය දැරීමෙන් එකී ආයතනවල ක්‍රියාකාරකම් වලට සෘජුව හා ක්‍රියාශීලීව දායක වීම තුලින් අන්‍යොන්‍ය වශයෙන් රබර් කර්මාන්තයේ උන්නතියට වාසි සහගතතාවයක් උදා කෙරිණි. 2012 වර්ෂයේ එකී ආයතනවල වාර්ෂික සමුළු වෙනුවෙන් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හා නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය) සහභාගි විය.

තවද එකී ආයතනවලට දේශීය රබර් මිල෴ නිෂ්පාදන හා අලෙවි තොරතුරු, වගා බිම් ප්‍රමාණ, ක්ෂේත්‍රයේ නියැලි සංඛ්‍යාවන් ඇතුළු අවශ්‍ය සියළු තොරතුරු කලට වේලාවට වර්ෂය පුරාම වාර්තා කරන ලදී. එසේම එම ආයතන මගින් සෙසු රටවල තොරතුරුද ලබා ගෙන අදාල පාර්ශවයන් අතර බෙදාහරින ලදී.

### 3.17 ප්‍රධාන පනත් යටතේ නඩු පැවරීම් කටයුතු

රබර් නැවත වගා කිරීම පිණිස සහනාධාර පනත යටතේ රබර් වගා අවසර පත්‍රයක් මත ආධාර ලබාගත් සෑම ඉල්ලුම්කරුවෙක්ම සියළුම ආධාර මුදල් ලබාගෙන නිම කරන තුරු෴ වගාව හොඳින් පවත්වා ගෙන යෑමට සහ අවශ්‍ය වැඩ කටයුතු කිරීමට සහනාධාර නියෝග අනුව බැඳී සිටී. අවසර පත්‍ර දරන්නන් ඔවුන්ගේ වගාව නොසලකා හරින්නේ නම් සහ අවසන් ආධාර වාරිකය ලබාගන්නා තෙක් වගාව හොඳින් පවත්වාගන නොයන්නේ නම් ලබාගෙන ඇති ආධාර මුදල් දෙපාර්තමේන්තුවට ආපසු ගෙවීමට නියෝග කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අදාල පනත අනුව ගැසට් පත්‍රයේ පල කරන ලද නියෝගවල විධි විධාන පරිදි ආධාර ලබන ඉඩමක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අවසර රහිතව අන්සතු කළ නොහැක.

මේ අනුව අවසර පත්‍රයේ වලංගු කාල සීමාව දීර්ඝ කර අවසර පත්‍ර දරන්නන්ට වගාව සම්පූර්ණ කිරීමට තරම් අවශ්‍ය කල් ලබාදේ රබර් නැවත වගා සහනාධාර පනතේ පරමාර්ථ ඉටු නොවන අයුරින්, සාර්ථකව රබර් වගාවක් පවත්වාගන යාමට අපොහොසත් වන (සහනාධාර ලබාගත් ) ඉඩම් හිමියන්ට, ලබාගත්

ආධාර ආපසු ගෙවීමට දන්වනු ලැබේ. එසේ නොගෙවන ඉඩම් හිමියන්ට අවසන් පියවරක් වශයෙන් නඩු පවරනු ලැබේ.

**2012 වර්ෂය**

| දිස්ත්‍රික්කය | අයකරගත් වගාකරුවන් සංඛ්‍යාව | අවසන් නිවේදන යවා අයකරගත් මුදල (රු.) | නඩු පවරා අයකරගත් මුදල (රු.) |
|---|---|---|---|
| ගාල්ල | | | |
| මාතර | | | 228364.30 |
| හම්බන්තොට | | | |
| කෑගල්ල | 36 | 386314.58 | 30000.00 |
| මොණරාගල | 04 | 12797.39 | - |
| කොළඹ | 08 | 37477.44 | - |
| රත්නපුර | 26 | 200782.21 | - |
| කළුතර | 83 | 616254.68 | - |
| **එකතුව** | **157** | **1253626.30** | **258364.30** |

**සංඛ්‍යා සටහන xix**

තවද දේශගුණික හා වෙනත් සාධාරණ හේතු මත වගාවන් අසාර්ථක වූ ගොවීන් සම්බන්ධයෙන් පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කරමින් උපදේශක මණ්ඩලයේ අනුමැතිය ලබා සහනාධාර මුදල් කපා හැරීමට ක්‍රියාකරන ලදී.

## 3.18 සහනාධාර ගෙවීම්

සමාලෝචනයට භාජනය වන 2012 වසර තුල පහත දැක්වෙන පරිදි ඒ ඒ වගාවන් සඳහා සහනාධාර මුදල් ගෙවීමට දෙපාර්තමේන්තුව සමත් විය.

**රබර් වගාව සඳහා සහනාධාර ගෙවීම්**

| ව්‍යපෘතිය | ගෙවූ මුදල් එකතුව ( රු.මි. ) |
|---|---|
| 2012 නැවත වගා සහනාධාර (පෞද්ගලික අංශය) | 95.73 |
| 2012 අළුත් වගා සහනාධාර(පෞද්ගලික) | 125.43 |
| 2012 නැවත වගා සහනාධාර (වැවිලි සමාගම්) | 66.27 |
| **එකතුව** | **287.43** |

**සංඛ්‍යා සටහන xx**

## 3.19 විශේෂ සංවර්ධන වැඩසටහන්

### 3.19.1 අම්පාර දිස්ත්‍රික්කයේ රබර් වගාව ව්‍යාප්ත කිරිම

2012 අයවැය යෝජනා අනුව අම්පාර දිස්ත්‍රික්කයේ රබර් වගාව ව්‍යාප්ත කිරීමට ගත් තීරණය අනුව හෙක්ටයාර 10,000 ප්‍රමාණයක රබර් වගා කිරීමට ඉලක්ක කොට ඇත. ඒ අනුව 2015 වර්ෂය වන විට එම ඉලක්කය සපුරා ගැනීමට අපේක්ෂිත වන අයුරින් රබර් වගා වැඩසටහන් මෙම වර්ෂයේදී සැලසුම් කරන ලදී. මෙහි මූලික පියවර වශයෙන් මෙම වසරේදී හෙක් 550 ක රබර් වගා ඉලක්කයක් පැවති අතර වසර අවසාන වන විටදී හෙක් 137.5 ක රබර් වගා කරන ලදී. මහඔය, පදියතලාව, උහන යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 3 ටම බෙදී යන ආකාරයට රබර් වගා වැඩසටහන ව්‍යාප්ත වී පවතී.

### 3.19.2 දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන - 2012

ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ මුලය අනුග්‍රහය ඇතිව ක්‍රියාත්මක කරන දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන රබර් අංශය තුලද 2012 වර්ෂයේදී ක්‍රියාවට නංවන ලදී. මේ යටතේ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පාළු සිටුවීම සඳහා රබර් පැල නොමිලේ සැපයීම, අපරිනත රබර් වගා බිම් වල අතුරු භෝග ලෙස කෙසෙල්, අන්නාසි, පැෂන් වගා කිරීම සඳහා නොමිලේ පැල සැපයීම, අස්වනු සහායක පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූවන් හට 50% සහනාධාර මත කිරි පිහි ලබාදීම හා ස්වයං රැකියාවක් ලෙස රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදනයේ යෙදෙන අයට ඔවුන්ගේ කර්මාන්තය වැඩි දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට 50%ක ආධාර මුදලක් ලබාදීම යන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. පාළු සිටුවීම සඳහා රබර් පැල බෙදා දීම මෙම වර්ෂයේදී සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වන මොණරාගල, හම්බන්තොට, වව්නියාව, පොළොන්නරුව යන දිස්ත්‍රික්කයන් වල ක්‍රියාත්මක කල අතර අතුරු භෝග වගා වැඩසටහන සහ කිරි පිහි බෙදා දීමේ වැඩසටහන රබර් වගා කරන සියළුම ප්‍රදේශ අවරණය වන පරිදි ක්‍රියාත්මක කරන ලදී. රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදන සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට 50%ක ආධාර මුදලක් ලබාදීමේ වැඩසටහන යටතේ පුද්ගලයින් පස්දෙනෙකුට ආධාර මුදල් ලබා දුන් අතර එයින් මෝටර් රථ අමතර කොටස්, රබර් බුෂ්, හයිඩ්‍රොලික් ඔයිල් සීල්, රබර් මවුන්ට්, බහුදින යාත්‍රා සඳහා අමතර කොටස්, පාවහන් නිෂ්පාදන සඳහා අවශ්‍ය වන උපකරණ මිලදී ගෙන ඇත. දැනට මෙහි ප්‍රතිඵලයන් ලෙස උසස් තත්ත්වයෙන් යුත් නිෂ්පාදන කිරීම හා ඔවුන්ගේ ජීවන තත්වය ඉහල නංවා ගැනීමටත් නව රැකියා අවස්ථා සැපයීමටත් හැකි වී ඇති බව වාර්තා වී

ඇත. දිවි නැගුම වැඩසටහන යටතේ මෙම වර්ෂයේදී රුපියල් මිලියන 10 මුදලක් මෙම දෙපාර්තමේන්තුවට වෙන්කර දී තිබූ අතර එහි ප්‍රගතිය පහත වගුවේ දැක්වේ.

| **වැඩසටහන** | **මූල්‍ය ප්‍රගතිය** | | | **භෞතික ප්‍රගතිය** | | |
|---|---|---|---|---|---|---|
| | වෙන් කල මුදල රු.මි. | වියදම රු.මි. | % | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | % |
| පාළු සිටුවීම සඳහා රබර් පැල සැපයීම (පැල) | 6.00 | 5.59 | 93 | 100,000 | 93,177 | 93 |
| අතුරු භෝග වගාව (පැල) | 2.00 | 1.92 | 96 | 67,000 | 74,406 | 111 |
| කිරි පිහි සැපයීම (පිහි ගණන) | 0.80 | 0.73 | 92 | 2600 | 2528 | 97 |
| රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදනය (පුද්ගලයින්) | 1.20 | 1.16 | 97 | 10 | 5 | 50 |
| එකතුව | 10.00 | 9.40 | 94 | - | - | - |

**සංඛ්‍යාන සටහන xxi**

## 3.20 ඒකාබද්ධ අරමුදල

| **වියදම් විෂය** | **මුළු ප්‍රතිපාදන ලැබීම් රු. මි.** | **ශුද්ධ වියදම් රු. මි.** |
|---|---|---|
| වැටුප් හා වේතන | 144.8 | 140.83 |
| ගමන් වියදම් | 7.60 | 7.42 |
| සැපයීම් | 3.08 | 2.64 |
| නඩත්තු වියදම් | 3.70 | 3.50 |
| ගිවිසුම්ගත සේවා | 15.35 | 13.85 |
| ඉන්ධන | 3.00 | 2.91 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 746.05 | 400.99 |
| ප්‍රාග්ධන වත්කම් | 2.3 | 0.71 |
| සම්මාදම් දායක මුදල් | 7.95 | 7.78 |
| අනිකුත් ප්‍රාග්ධන වියදම් | 18.00 | 15.76 |
| වෙනත් ආයෝජන | 100.00 | 35.61 |
| **එකතුව** | **1051.83** | **632.00** |

**සංඛ්‍යා සටහන xxii**

## 3.21 ප්‍රචාරක වැඩසටහන්

- දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය වෙනුවෙන් ප්‍රදර්ශන කුටියක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඔයාමඩුවේදී පවත්වාගෙන යන ලදී.

- දැයට ජවය අධ්‍යාපනික හා වෙළඳ ප්‍රදර්ශනය වෙනුවෙන් ප්‍රදර්ශන කුටියක් යක්කල අනුර මහා විද්‍යාලයේදී ( දින 04ක් ) පවත්වාගෙන යන ලදී.

- දිවි නැගුම ගෘහ ආර්ථික ඒකක විසිපන් ලක්ෂයක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩ සටහන යටතේ කළුතර දිස්ත්‍රික් ගෘහ කර්මාන්ත ප්‍රවර්ධන ප්‍රදර්ශනය වෙනුවෙන් ප්‍රදර්ශන කුටියක් කළුතර උතුර තිස්ස විද්‍යාලයේදී ( දින 04ක් ) පවත්වන ලදී.

- බද්ධ කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන, වෘත්තීය මට්ටමේ කිරි කැපුම් ශිල්පීන් පුහුණු වැඩ සටහන, අස්වනු සහායකයන් පුහුණු කිරීමේ වැඩ සටහන ආදියේ පුහුණුව ලැබූ පිරිසට ප්‍රදානය කිරීම සඳහා සහතික පත්‍ර වර්ග තුනක් මුද්‍රණය කිරීම.

- නැගෙනහිර පළාතේ රබර් වගාව හෙක්ටයාර් 550 ක ව්‍යාප්ත කිරීම සඳහා ඊට අදාලව බැනර්, පෝස්ටර් හා අත් පත්‍රිකා මුද්‍රණය කිරීම ( බැනර් 60, පෝස්ටර් 3000 ක් සහ අත්පත්‍රිකා 5000 ) ක් මුද්‍රණය කිරීම.)

- රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා එක් දින වැඩමුළුවක් අතුරුගිරියේ ජාතික වැවිලි කලමණාකාරිත්ව ආයතනයේදී පැවැත්වීම.

- වැඩුණු රබර් වගාවට වැසි ආවරණ යෙදීම, රබර් පැල නිෂ්පාදනය පිළිබඳව පුවත්පත් දැන්වීම් පල කිරීම.

- වැසි ආවරණ පිළිබඳව ගොවීන් දැණුවත් කිරීම සඳහා ප්‍රචාරාත්මක වැඩසටහන් පැවැත්වීම.

- වෘත්තීය මට්ටමේ කිරි කැපුම් ශිල්පීන් පුහුණු කිරීමේ වැඩ සටහන් 10 ක් පැවැත්වීම සඳහා කටයුතු කිරීම හා පාඨමාලාව ආරම්භක දින හා අවසාන දින සහභාගිවී අවශ්‍ය සහයෝගය ලබාදීම.

- සාමාන්‍ය කිරිකැපුම් ශිල්පී පුහුණු වැඩ සටහන් 115 ක් පැවැත්වීම සඳහා කටයුතු සංවිධානය කිරීම.

- බද්ධ කරුවන් පුහුණු කිරීමේ වැඩ සටහන් 07 ක් පැවැත්වීමට කටයුතු කිරීම.

- රබර් සංවර්ධන නිලධාරීන් සඳහා සේවාසංස්කරණ පාඨමාලාවක් ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේදී පැවැත්වීමට කටයුතු කිරීම. (මෙම පුහුණුව නිලධාරීන් සියලුම දෙනාට අවස්ථා තුනකදී ලබා දෙන ලදී.)

- අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාව, මහඔය හා උහන යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ඇතුලත හෙක්ටයාර් 550 ක රබර් අලුතින් වගා කිරීම සඳහා ඉඩම් හිමියන් දැණුවත් කිරීමට රැස්වීම් 28 ක් පැවැත්වීමට ජංගම ප්‍රචාරක කටයුතු කල අතර රබර් කර්මාන්තයේ වැදගත්කම පිළිබද දේශන පවත්වන ලදී.

- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව නිෂ්පාදනය කරන ලද "රබර්" නැමැති වීඩියෝ චිත්‍රපටය නිෂ්පාදනය කිරීමට සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම. ( නැගෙනහිර පලාතේ රබර් වගාව ව්‍යාප්ත කිරීම සඳහා අරමුණු කරගත් වීඩියෝ චිත්‍රපටයකි. තුන් වතාවක් ජාතික රූපවාහිණියේ විකාශනය කිරීමට කටයුතු කරන ලදී.)

- රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන සුළු පරිමාණ කර්මාන්ත කරුවන්ට දිවිනැගුම යටතේ මූල්‍ය ආධාර සැපයීම සඳහා සහායවීම.

- රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ පාලන වාර්තාවේ පිටපත් 1050 ක් සීඩී තැටිවලට අන්තර්ගත කිරීම සඳහා කටයුතු කිරීම.

➢ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ රැස්වීම් ශාලාවේ එල්ලා තැබීම සඳහා ඡායාරූප සකස් කිරීමට අවශ්‍ය මූලික කටයුතු කිරීම.

## 3.22 සෙස් බදු පිළිබඳ කටයුතු

**(1) ලියාපදිංචිය**

| | |
|---|---|
| ලියාපදිංචි ආයතන ගණන | 160 |
| ගෙවිය යුතු මුළු සමාගම් ගණන | 55 |
| සෙස් ගෙවන සමාගම් ගණන | 51 |

**සංඛ්‍යා සටහන xxiii**

**දේශීය පරිභෝජනය අනුව අය කළ සෙස් බද්ද**

| අදාල මාසය | ආදායම (දේශීය පරිභෝජනය අනුව) රු. |
|---|---|
| ජනවාරි | 17453711.22 |
| පෙබරවාරි | 21859435.92 |
| මාර්තු | 30879550.64 |
| අප්‍රේල් | 20263985.03 |
| මැයි | 14389241.64 |
| ජුනි | 29785387.65 |
| ජුලි | 15226900.63 |
| අගෝස්තු | 17060860.51 |
| සැප්තැම්බර් | 17844473.40 |
| ඔක්තෝම්බර් | 18686135.50 |
| නොවැම්බර් | 15990014.97 |
| දෙසැම්බර් | 16008110.23 |
| **එකතුව** | **235447807.34** |

**සෙස් බදු සංඛ්‍යා සටහන -xxiv**

රබර් ආනයනය හා අපනයනය මත අය කරන ලද සෙස් බදු මුදල් පිළිබඳ විස්තර මෙසේය.

**ආනයන හා අපනයන මත අය කළ සෙස් බද්ද**

| අදාල මාසය | ආනයනය මත රු. | අපනයනය මත රු. |
|---|---:|---:|
| ජනවාරි | 112228743.00 | 5643290.00 |
| පෙබරවාරි | 72426125.00 | 2021204.00 |
| මාර්තු | 96882386.00 | 21084484.00 |
| අප්‍රේල් | 7174220.00 | 295872.00 |
| මැයි | 6331013.00 | 52934.00 |
| ජුනි | 4998962.00 | 84506.00 |
| ජුලි | 5559007.00 | 312374.00 |
| අගෝස්තු | 5595829.00 | 100.00 |
| සැප්තැම්බර් | 3842663.00 | 13236.00 |
| ඔක්තෝම්බර් | 4921037.00 | 279.00 |
| නොවැම්බර් | 4586553.00 | 79940.00 |
| දෙසැම්බර් | 3631149.00 | 3768.00 |
| **එකතුව** | **328177687.00** | **29591987.00** |

**සෙස් බදු සංඛ්‍යා සටහන XXV**

### 3.23 තොරතුරු තාක්ෂණය හා පරිගණක කටයුතු.

- රබර් වගා සහනාධාර වැඩසටහන අවශ්‍ය සංශෝධන සහිතව, මතුවන ගැටළුවලදී ප්‍රාදේශීය කාර්යාලවල පරිගණක අංශවල සේවයේ නියුතු නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දෙමින් විධිමත් පරිදි පවත්වා ගෙන යාම.
- රබර් වගා සහනාධාර වැඩසටහනට අදාලව ප්‍රධාන කාර්යාලයට හා ප්‍රාදේශීය කාර්යාලවලට අවශ්‍ය වන වාර්තා හා තොරතුරු ලබා දීම.
- දෙපාර්තමේන්තුවේ තැපැල් වැඩසටහන තොරතුරු සුරක්ෂිතභාවය තහවුරු කරමින් විධිමත් පරිදි පවත්වා ගෙන යාම.
- ICTA ආයතනයේ උපදෙස් පරිදි ක්‍රියාත්මක වන RIMS ව්‍යාපෘතියෙහි System Study පියවර සඳහා උපදේශකවරයකු තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවා ඒ සඳහා වන උපදේශන සේවා ප්‍රසම්පාදන කමිටුවේ තාක්ෂණික ඇගයීම් වාර්තාව සම්පූර්ණ කර ඇත.
- දෙපාර්තමේන්තු වෙබ් අඩවිය අවශ්‍ය චක්‍රලේඛ, තොරතුරු ඇතුලත් කරමින් සතියකට දෙවරක් රබර් මිළ යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යාම.
- 2012 වර්ෂයට අදාලව ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාලවල පරිගණක, UPS යන්ත්‍ර මිලදී ගැනීමේ කටයුතු සම්පූර්ණ කර ඇත.

### 3.24 පරිපාලන කටයුතු

- රියදුරන් 07 දෙනෙකු බඳවා ගැනීම.
- කාර්යාල සේවක සේවය සඳහා 07 ක් බඳවා ගැනීම.
- ට්‍රැක්ටර් රියදුරු 07 ක් බඳවා ගැනීම.
- උපාධිධාරී තනතුරු 19 ක් අනුමත කර ගැනීමට කටයුතු කිරීම, ගොඩනැගිලි නඩත්තු නිලධාරී පරිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අනුමත කර ගැනීම.
- රබර් සංවර්ධන නිලධාරි පරිපාටිය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කිරීම.
- ලොරි සහායක බඳවා ගැනීමේ පරිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අනුමත කර ගැනීම හා බඳවා ගැනීමට මූලික පියවර ගැනීම.
- සංවර්ධන සහකාර සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාව යටතේ අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කිරීම.
- රබර් සංවර්ධන නිලධාරීන් I පන්තියට උසස්වීම් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම.
- වාහන 05 ක් අළුත්වැඩියා කිරීම.
- තැපැල විධිමත් පරිදි සිදු කිරීම සඳහා මෘදුකාංගයක් භාවිතා කිරීම.
- නිවාඩු විධිමත් පරිදි සිදු කිරීමට අවශ්‍ය චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීම.
- අභ්‍යාසලාභීන් විසි දෙනෙක් සඳහා ප්‍රධාන කාර්යාලය ඇතුළු ප්‍රාදේශීය කාර්යාලවලින් පුහුණුව ලබා දීම.

- දෙපාර්තමේන්තුවේ වායු සමීකරණ යන්ත්‍ර ෆැක්ස් යන්ත්‍ර සඳහා සේවා ගිවිසුම් ඇති කර ගනිමින් ඒවායේ කල් පැවැත්ම සඳහා සේවා සපයා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.
- තත්ව කව පිහිටුවීම.

## විනය පාලන කටයුතු

- රබර් සංවර්ධන නිලධාරී - මූලික විමර්ශන 06ක් සිදු කිරීම.
  රබර් සංවර්ධන නිලධාරී එක් අයෙකු සේවයෙන් පහ කිරීම.
  රියදුරු - මූලික විමර්ශන 04ක් සිදුකිරීම.
- සංවර්ධන සහකාර මූලික විමර්ශනයක් සිදු කිරීමට පියවර ගැනීම.

## තවාන්වල යටිතල පහසුකම් සංවර්ධනය

- වැලිකඩමුල්ල පැල තවානේ ගබඩාව ඉදි කිරිම.
- මීරිගම පැල තවානේ ගබඩාව ඉදි කිරිම.
- මීරිගම පැල තවානේ ජලපොම්පාගාරයක් ඉදිකිරීම.
- කරපිංච පැල තවානේ බීජ පාත්ති සකස් කිරිම.
- කරපිංච පැල තවානේ තවාන් කළමණාකරු නිල නිවස අලුත්වැඩියාව.
- කරපිංච පැල තවානේ දැල් ආවරණය ඉදි කිරීම.
- කරපිංච පැල තවානේ ජලපොම්පාගාරය හා ජල සැපයුම් ඉදි කිරීම.
- මිද්දෙණිය තවානේ ජල කුළුණ ඉදි කිරීම.
- ගුරුගොඩ පැල තවානේ පැල ගබඩාව ඉදි කිරිම.
- කුඹුක්කන පැල තවානේ වැට සකස් කිරීම හා ගේට්ටුව දැමීම.
- වැලිකඩමුල්ල පැල තවානේ වතුර ටැංකියේ පැති බැම්ම ඉදි කිරීම.
- ඇගල්ඔය පැල තවානේ වගා ළිඳ (අංක 01) ඉදි කිරීම.

## ගොඩනැගිලි සංවර්ධන කටයතු

- දැරණියගල රබර් සංවර්ධන නිලධාරී නිල නිවස අලුත්වැඩියාව.
- දෙහිඕවිට රබර් සංවර්ධන නිලධාරී නිල නිවස අලුත්වැඩියාව.
- යටියන්තොට රබර් සංවර්ධන නිලධාරී නිල නිවස අලුත්වැඩියාව.
- අඟුරුවැල්ල රබර් සංවර්ධන නිලධාරී නිල නිවස අලුත්වැඩියාව.
- අම්තිරිගල රබර් සංවර්ධන නිලධාරී නිල නිවස අලුත්වැඩියාව.
- නාගොඩ රබර් සංවර්ධන නිලධාරී නිල නිවස අලුත්වැඩියාව.
- රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයේ ඉදිරිපස පැති බැම්ම අලුත්වැඩියාව.
- ගැටහැත්ත රබර් සංවර්ධන නිලධාරී නිල නිවස අලුත්වැඩියාව.

- පැරඩයිස් අංක 01 නිල නිවස අලුත්වැඩියාව.
- කඹුරුපිටිය රබර් සංවර්ධන නිලධාරී නිල නිවස අලුත්වැඩියාව.
- තුන්අදහේන රබර් සංවර්ධන නිලධාරී නිල නිවස අලුත්වැඩියාව.
- කෑගල්ල සියඹලාපිටිය සහකාර අධ්‍යක්ෂ නිල නිවස අලුත්වැඩියාව.
- කළුතර පැලවත්ත රබර් සංවර්ධන නිලධාරී නිල නිවස අලුත්වැඩියාව.
- මොණරාගල රබර් සංවර්ධන නිලධාරී නිල නිවස අලුත්වැඩියාව.
- බඩල්කුඹුර රබර් සංවර්ධන නිලධාරී නිල නිවස අලුත්වැඩියාව.

## 3.25 නැවත වගා කිරීමේ උපදේශක මණ්ඩලය

1953 අංක 36 දරණ රබර් නැවත වගා සහනාධාර පනතේ 10 වන වගන්තිය සහ 1956 අංක 11 දරණ රබර් පාලන පනතේ 40 හා 41 යන වගන්ති වලට අනුකූලව මෙම මණ්ඩලය ස්ථාපනය කොට ඇත.

මෙම මණ්ඩලය රබර් නැවත වගා සහනාධාර පනත සම්බන්ධව පැන නැගෙන කරුණු පිළිබඳ ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමන්ට උපදෙස් ලබාදීම සහ රබර් නැවත වගා කිරීමේ සහනාධාර ක්‍රමය පරිපාලනය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් වරයාට උපදෙස් ලබාදීම සිදු කරනු ලබයි.

මෙහි සභාපති නිළ බලයෙන් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වේ. ඉතිරි සාමාජිකයින් ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් පත් කරනු ලබයි.

## 3.26 විගණන කටයුතු

- ධාවන සටහන් පරීක්ෂා කිරීම - 2011 වර්ෂය (LI -0668, LI-0669, LI -0683, සහ LI-0684)
- අභ්‍යන්තර විගණන පරීක්ෂණය - මීරිගම තවාන
- අභ්‍යන්තර විගණන මූලික හා පළමු කාර්තු වාර්තාව - 2012
- 2011 වර්ෂය තුල පැළ බෙදා හැරීම පරීක්ෂා කිරීම - මොණරාගල ප්‍රාදේශීය කාර්යාලය
- මීරිගම තවානේ අක්‍රමිකතා පරීක්ෂා කිරීම
- ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම - ප්‍රධාන කාර්යාලය- මුල් කාර්තුව
- අභ්‍යන්තර විගණන පරීක්ෂණය - වැලිකඩමුල්ල තවාන
- පැමිණීමේ දීමනා ගෙවීම පරීක්ෂා කිරීම - කුඹුක්කන පැල තවාන මොණරාගල
- අභ්‍යන්තර විගණන දෙවන කාර්තු වාර්තාව - 2012
- අභ්‍යන්තර විගණන පරීක්ෂණය - කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලය 2012
- ඉදිකිරීම් සම්බන්ධ ටෙන්ඩර් ලිපිගොනු පරීක්ෂා කිරීම

# 4. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු

2012 වසරේ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලය පහත පරිදි වේ. 2012 වසරේ සමස්ථ ස්ථිර කාර්ය මණ්ඩලය (2012.12.31 දිනට) 346 කි.

| තනතුර | දැනට සිටින කාර්යය මණ්ඩලය |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්-ශ්‍රී ලං.ප.සේ | 1 |
| අධ්‍යක්ෂ- ශ්‍රී ලං.ප.සේ | 2 |
| ප්‍රධාන ගණකාධිකාරී ශ්‍රී ලං.ග.සේ | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ශ්‍රී ලං.ප.සේ ,<br>සහකාර අධ්‍යක්ෂ -ශ්‍රී ලං.ප.සේ | 10 |
| සහකාර අධ්‍යක්ෂ -ශ්‍රී ලං.ක්‍රි.සේ | 1 |
| ගණකාධිකාරී- ශ්‍රී ලං.ග.සේ | 3 |
| පරිගණක පද්ධති විශ්ලේෂක | 1 |
| අභ්‍යන්තර විගණක | 1 |
| විගණක ලිපිකරු | 1 |
| පරිපාලන නිලධාරී | 3 |
| අයවැය සහකාර | 1 |
| රාජ්‍ය කළමණාකරණ සහකාර | 116 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර | 1 |
| ලිපිකරු යතුරු ලේඛක | 16 |
| ප්‍රචාරක නිලධාරී | 1 |
| සහකාර ප්‍රවෘත්ති නිලධාරී | - |
| සංවර්ධන නිළධාරී | - |
| සංවර්ධන සහකාර | 6 |
| රියදුරු ට්‍රැක්ටර් | 33 |
| ලොරි සහායක | 1 |
| කාර්යාල සේවක සේවය | 25 |
| රබර් සංවර්ධන නිලධාරී : විශේෂ | - |
| ජ්‍යෙෂ්ඨ රබර් සංවර්ධන නිලධාරී | - |
| රබර් සංවර්ධන නිලධාරී | 114 |
| තවාන් කළමණාකරු | 7 |
| කම්කරු | - |
| ගොඩනැගිලි නඩත්තු නිලධාරී | - |
| වාහන නඩත්තු සහකාර - මෝටර් කාර්මික | - |
| මුරකරු | 1 |
| මුරකරු (ආදේශක) | - |

**කාර්ය මණ්ඩලය සංඛ්‍යා සටහන xxvi**

## 5. අනෙකුත් ආයතනවල සේවාවන් ඉටුකිරීම.

ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් කරන ලද පත්කිරීම් ප්‍රකාර වර්ෂය තුල පහත සඳහන් ආයතන වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය දරමින් පැවරුන රාජකාරි ඉටු කරන ලදී.

1) ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය
2) තුරුසවිය අරමුදල
3) ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව
4) වතු ඉඩම් කැබලි කිරීම පාලනය කිරිමේ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර වලට සහභාගි වීම, අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම, තීරණ සඳහා සහාය දීම, අවශ්‍ය එකඟතා සහ අනුමැතීන් පළ කිරීම, කටයුතු විමර්ශනය කිරීම, එකී ආයතනවල ක්‍රියාත්මක වැඩ සටහන් සඳහා දායකත්වය සැපයීම යන කටයුතු මෙහිදී ඉටු කරන ලදී.

මීට අතිරේකව දෙපාර්තමේන්තුවේ සේවාවන් අවශ්‍යකළ සියළුම අමාත්‍යංශ දෙපාර්මේන්තු, අනකුත් රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන පුද්ගලයන්ට ඔවුන් ඉල්ලා සිටි සේවාවන් තොරතුරු හා සහායන් නොඅඩුව ලබාදුනි. පාසැල් ප්‍රදර්ශන සහාය දේශන හා තොරතුරු සහාය. ආයතනවලට හා පුද්ගලයන්ට අවශ්‍ය සංඛ්‍යාත්මක තොරතුරු හා පැහැදිලි කිරීම්, ශිල්පීය උපදෙස් ආදිය ලබාදීම මේ අතර විය.

මේ සේවාවන් හා තොරතුරු ලබාදීම ප්‍රධාන කාර්යාලයේ ප්‍රදේශීය කාර්යාලවල හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේද තවාන් කළමණාකරුවන්ගේද සහයෙන් සිදුවිය.

## 6. පොදු කරුණු

### 6.1 නව වසරේ රාජකාරි ආරම්භ කිරිම

පෙර වසර වලදී මෙන්ම 2012 වසර ආරම්භයේදී ද මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හා සියලුම ප්‍රාදේශිය කාර්යාල වල රාජකාරි ඇරඹීමට පෙර කාර්ය මංඩලයේ සියලුම දෙනා එක්ව ජාතික කොඩිය ඔසවා ජාතික ගීය ගයනා කරන ලදී. ඉන්පසු සියලු දෙනාම රාජ්‍ය සේවයේ ප්‍රතිඥාව ලබා දී සේවය සඳහා කැපවීමට අදිටන් කර ගන්නා ලදී. ආගමික චාරිත්‍ර ඉටු කිරිමෙන් පසු  දෛනික කාර්යය ආරම්භයේදී රැස්වීමක් පවත්වා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මේ වසර තුළ සිදුකළ යුතු ඉලක්ක සහ වගකීම් පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල් විසින් හා ප්‍රාදේශිය කාර්යාල වල ප්‍රධානින් විසින් කාර්ය මණ්ඩලය දැනුවත් කරන ලදී.

### 6.2 උත්සව

වාර්ෂිකව සිදු කරනු ලබන වෙසක් උත්සව වැඩ සටහන් හා සැරසිලි ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාල වලත් දෙපාර්තමේන්තුව යටතේ ඇති තවාන් වලත් සිදු කරන ලදී. මෙහිදී පෙර වර්ෂ වලටද වඩා වැඩි උනන්දුවකින් කාර්ය මණ්ඩල ක්‍රියා කළ අතර දර්ශනීය සැරසිලි වලින් ආයතන සුවිශේෂී ලෙස අලංකාර කර තිබුණි. කෑගල්ල කාර්යාලයේ වෙසක් පොහොය නිමිත්තෙන් ස්වාමීන් වහන්සේ නමක් කාර්යාලයට වැඩමවා ධර්ම දේශණයක් පවත්වා පිරිකර පූජා කරන ලද අතර සැරසිලි කර විදුලි බුබුළු සහ වෙසක් පහන් දල්වන ලදී. ගාල්ල කාර්යාලයේද  නිලධාරීන්ගේ කවයන් විසින් වෙසක් කූඩු නිර්මාණය කරන ලදී. ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය සඳහා ජාතික වැවිලි සම්මාන උළෙළේ 2012 දී හොඳම කුඩා රබර් වගා ඉඩම සඳහා ප්‍රථම ස්ථානය ලැබීම මෙම වර්ෂයේ සිදු වූ විශේෂිත සිදුවීමක් ලෙස සඳහන් කළ හැකිය.

(1-A)

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / துலைவா / My No — එල්පී/ඊ/ආර්සීඑෆ්/එෆ්ඒ/2012 | ඔබේ අංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date — 2013 සැප්තැම්බර් 03 දින |

අධ්‍යක්ෂ ජනරාල්,
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව.

**රබර් පාලන අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව.**

---

රබර් පාලන අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1957 අංක 45 දරන රබර් පාලන (සංශෝධිත) පනත මගින් සංශෝධිත 1956 අංක 11 දරන රබර් පාලන පනතේ (436 අධිකාරය) 39 (3) (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka
දුරකථනය / தொலைபேசி / Telephone 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

(1-B)

1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

---

2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට රබර් පාලන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

භෞතිකව නොපවත්නා රු.985,925 ක්වූ වත්කම් අයිතම 07 ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

එකතුව රු.652,775 ක්වූ ජංගම වත්කම් ශේෂ 13 ක් හා එකතුව රු.239,784 ක් වූ ජංගම බැරකම් ශේෂ 05 ක් වර්ෂ 08 කට වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම ඉදිරියට ගෙනවිත් තිබුණි.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ). | ණය සහන සහා අරමුදල | 130,328 | විස්තරාත්මක උපලේඛන, ශේෂ සනාථ කිරීම්. |
| (ආ). | අත්තිකාරම් ගිණුම් 06 කට අදාළ ශේෂ | 287,379 | පැහැදිලි කිරීමේ සටහන්. |
| (ඇ). | රබර් වෙළෙඳ ලේඛන තොග | 6,360 | තොග ලේඛන |
| (ඈ). | ගෙවිය යුතු අත්තිකාරම් | 22,031 | විස්තරාත්මක උපලේඛන, ශේෂ සනාථ කිරීම්. |
| (ඉ) | අනෙකුත් ජංගම වගකීම් | 17,753 | ශේෂ සනාථ කිරීම්. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය ලෙස රු.463,652 ක අතිරික්තයක් දැක්වූ අතර, ඉකුත් වර්ෂයේ එය රු.275,280 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල අතිරික්තයේ වැඩිවීම රු.188,372 ක් විය. කෙසේ වෙතත් අරමුදලේ මුළු ආදායම ස්ථාවර තැන්පතු පොලී හා ඉතුරුම් තැන්පතු පොළී ආදායමෙන් පමණක් සමන්විත වූ අතර, එය පිළිවෙලින් රු.347,199 ක් සහ රු.147,686 ක් විය.

(1-P)

4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

4.1 අරමුදලේ ක්‍රියාකාරකම් පිළිබඳ වර්තමාන තත්ත්වය

-----------------------------------------------------

ක්‍රියාකාරීත්වයේ නොපවතින රබර් පාලන අරමුදල ඇවර කිරීම පිණිස අදාල පනතේ විධි විධාන අනුව සකස් කළ ගිණුම් වාර්තාවේ වත්කම් හා වගකීම් නිරවුල් කර එයට විගණකාධිපතිගේ එකඟතාවය ලබා ගත යුතු බව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද 2011 ඔක්තෝබර් 21 දිනැති ලිපිය මගින් දැනුම් දී තිබුණි.

4.2 අයවැය පාලනය

---------------------

අරමුදල යටතේ වියදම් දැරීමක් සිදු නොවන බැවින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

5. පද්ධති හා පාලනයන්

--------------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / துலைவா / My No : එල්පී/ඊ/ආර්ආර්එස්එෆ්/එෆ්ඒ/2012

ඔබේ අංකය / உமது இல / Your No. :

දිනය / திகதி / Date : 2013 සැප්තැම්බර් 20 දින

අධ්‍යක්ෂ ජනරාල්,

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව.

රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව.

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

පිටපත් : 01. ලේකම් - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
02. ලේකම් - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka
දුරකථනය / தொலைபேசி / Telephone : 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. : 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail : oaggov@sltnet.lk

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / துலைவா / My No: එල්පී/ඊ/ආර්ආර්එස්එෆ්/එෆ්ඒ/2012

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date: 2013 සැප්තැම්බර් 30 දින

අධ්‍යක්ෂ ජනරාල්,
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව.

**රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව.**

---

රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1953 අංක 36 දරන රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදල් පනතේ (437 අධිකාරය) 6(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail: oaggov@sltnet.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ අහිතකර විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑහැකිව තිබුණි.

2. මූල්‍ය ප්‍රකාශන

---------------

2.1 අහිතකර විගණන මතය

---------------------------

ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින මෙම අරමුදල පනතේ විධිවිධාන අනුව ඇවර කිරීම සඳහා අඛණ්ඩ පැවැත්මක් නොමැති පදනමින් යුක්තව ගිණුම් ඉදිරිපත් කළයුතු වුවත් එසේ ක්‍රියාකර නොතිබුණි.

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රබර් නැවත වගා කිරීමේ අරමුදලට අයත් රු.63,438,233 ක් වටිනා ස්ථාවර වත්කම් භෞතිකව හඳුනාගෙන නොතිබූ අතර මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා නොකරන මෙම වත්කම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.904,699 ක් ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි.

(ආ) වායු සමීකරණ යන්ත්‍ර හා කාර්යාලීය ලී බඩු උපකරණ රු.7,609,866 ක් එකම ගිණුමක සටහන් කර තිබුණි.

2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත සඳහන් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

| | විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | 63,438,233 | සමීක්ෂණ මණ්ඩල වාර්තා, ස්ථාවර වතස්ම් ලේඛනය, හිමිකම් ඔප්පු |
| (ආ) | අත්තිකාරම් | 15,220,514 | විස්තරාත්මක උපලේඛන , ශේෂ සනාථ කිරීම් |
| (ඇ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් | 9,617,628 | විස්තරාත්මක උපලේඛන, ශේෂ සනාථ කිරීම් |
| (ඈ) | ලැබිය යුතු ශේෂ | 96,544,110 | මූලාශ්‍ර ලියවිලි, ශේෂ සනාථ කිරීම් |
| (ඉ) | ගෙවිය යුතු ශේෂ | 18,871,810 | විස්තරාත්මක උපලේඛන, ශේෂ සනාථ කිරීම් |

2.2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජංගම වත්කම් යටතේ දැක්වෙන රු.96,544,110 ක් වූ ශේෂ 13 ක් වසර 08 ක කාලයක සිට හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වටිනාකම රු. 18,871,810 ක්වූ වගකීම් විෂයයන් 14 ක් වසර 07 ක පමණ කාලයක සිට පැවත එනු ලබන අතර මෙම වගකීම් නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

3. <u>මූල්‍ය සමාලෝචනය</u>

3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.383,580 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.392,390 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,810 ක වර්ධනයක් පෙන්නුම් කෙරීණි. අරමුදලේ මුළු ආදායම ආයෝජන පොලී ආදායමෙන් පමණක් සමන්විත වූ අතර එය රු. 561,119 ක් විය.

4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

4.1 <u>කාර්ය සාධනය</u>

4.1.1 අරමුදලේ පැවැත්ම

---------------------

ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින මෙම අරමුදල ඈවර කිරීම පිණිස අදාල පනතේ විධි විධාන අනුව හා 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කළ විගණිත ගිණුම්හි දැක්වෙන වත්කම් හා වගකීම් නිරවුල් කර එයට විගණකාධිපතිගේ එකඟතාවය ලබා ගත යුතු බව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද 2011 ඔක්තෝබර් 21 දිනැති ලිපිය මගින් දැනුම් දී තිබුණි. කෙසේ වෙතත් 2013 ජූනි 28 දින වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

5. <u>ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය</u>

5.1 අයවැය පාලනය

------------------

අරමුදල යටතේ වාර්ෂිකව වියදම් දැරීමක් සිදු නොවන බැවින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

-------------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කළයුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) අත්තිකාරම් පියවීම

(ඇ) ණයගැති/ ණයහිමි පාලනය

(ඈ) ස්ථාවර වත්කම්

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති.